
# ජාතික කියවීමේ මාසය

## ඔක්තෝබර් 2011

## සමරු කලාපය



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ජාතික කියවීමේ මාසය

## ඔක්තෝබර් 2011

# සමරු කලාපය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ජාතික කියවීමේ මාසය
## ඔක්තෝබර් 2011
## සමරු කලාපය

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය


ISBN 978-955-8383-71-1

ප්‍රකාශනය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත, කොළඹ 07.
දුරකථන :2698847
ෆැක්ස් :2685201
web :www.natlib.lk

මුද්‍රණය
විජිත ප්‍රින්ටර්ස් ඇන්ඩ් ට්‍රේඩර්ස්
137, ලෙස්ලි රණගල මාවත, කොළඹ 08.

# පටුන


| | |
|---|---|
| සභාපතිතුමාගේ පණිවුඩය | v |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | vi |
| දේශීය ප්‍රකාශන ක්ෂේත්‍රයේ නව මං සලකුණු | 1 |
| කියවීම සංවර්ධනයට මාවතයි | 8 |
| කියවීම එදා සහ අද | 13 |
| ලේඛන සංරක්ෂණය හා ප්‍රවේශ වර්ධනය සඳහා සංඛ්‍යාංකකරණය යොදාගැනීමේ අවශ්‍යතාව | 19 |
| තොරතුරු සාක්ෂරතාව හා පොතපත කියවීම | 23 |
| සම්මානලාභී පුස්තකාල | 31 |

# සභාපතිතුමාගේ පණිවුඩය

සාහිත්‍ය මාසයෙන් ඇතිවන උද්යෝගය තුළින් එළඹෙන කියවීමේ මාසයේ දී රට පුරා කියවීම් රුචිය වර්ධනය කිරීම පිළිබඳ ව වැඩසටහන් මාලාවක් මෙවර ද දියත් කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කිරීම ඉතා අගයකොට සලකමි. දැනුම හා තොරතුරු වර්තමාන ලෝකයේ සෑම ක්ෂේත්‍රයක ම වැදගත් මෙන්ම තීරණාත්මක සාධකය බව අවිවාදයෙන්ම පිළිගෙන ඇති කරුණකි. නව විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල වර්ධනය හේතුවෙන් මෙන් ම අපගේ සාම්ප්‍රදායික දැනුම පිළිබඳ ගවේශන හේතුවෙන් ද අති විශාල දැනුම් හා තොරතුරු සම්භාරයක් අප සතුව ඇත. සෑම මොහොතකම මෙම දැනුම තව තවත් වර්ධනය වේ. කියවීම තුළින් යහපත් පුරවැසියෙකු වශයෙන් සමාජයට වැඩදායක ලෙස ජීවත්වීමට ද මඟ පෙන්වයි.කියවීම හුරු කිරීම මගින් දැයේ දරුවන් දැනුමෙන් සපිරි බුද්ධිමත් දරු පරපුරක් බවට පත්කළ හැකිය. පොතපත කියවීම තුළින් දැනුමෙන් සපිරි පුද්ගලයන් බිහි කිරීම පමණක් නොව යහපත් පුරවැසියෙකු වශයෙන් සමාජයට වැඩදායකු ලෙස ජීවත්වීමටද මඟ පෙන්වයි. ජාතික කියවීමේ මාසය තේමා කොට ගනිමින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛක සේවා මණ්ඩලය විසින් වැඩසටහන් රාශියක් දියත් කිරීමට කටයුතු යොදා තිබේ. මේවා අතර විවිධ ජනසන්නිවේදන මාධ්‍ය උපයෝගීකර ගනිමින් පොතපත කියවීමේ වැදගත්කමට අදාළ ප්‍රචාරක වැඩසටහන් දියත් කිරීම, පාසැල් ළමුන් ඉලක්ක කර ගනිමින් විවිධ අන්දමේ කියවීමේ රුචිය වර්ධනය වැඩසටහන් මෙන්ම පොදු පාඨක ප්‍රජාව ඉලක්ක කර ගනිමින් මහජන පුස්තකාල කේන්ද්‍ර කොටගෙන එවැනි ම අන්දමේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා තිබේ.

මහාචාර්ය සෝමරත්න බාලසූරිය
සභාපති

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

ජනතාවගේ තොරතුරු සාක්ෂරතාව වර්ධනය කිරීමේ අරමුණින් 2004 වසරේ සිට සෑම වසරකම ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය විසින් නම් කර ඇත. මෙම වැඩ සටහන අට වන වරටත් 2011 වසරේ ඔක්තෝබර් මාසය තුළ "පරිපූර්ණ සමාජයක් උදෙසා කියවමු" යන අරමුණින් යුතුව ක්‍රියාත්මක කෙරේ. සාම්ප්‍රදායික අරුතින් කියවීම ලෙස හැඳින්වුව ද වඩා නූතන අරුතින් එය තොරතුරු ගවේශණය ලෙස හැඳින්වේ. වර්තමානයේ දැනුම් ලොවට ප්‍රවේශ වීමේ අසහාය මාර්ගය වී ඇත්තේ කියවීමයි. කියවීම තුළින් තමාට, සමාජයට හා රටට අති විශාල මෙහෙයක් ඉටු කිරීමට හැකිවනු ඇත. ඒ සඳහා කාලීන තොරතුරු ඇතුළත් පොතපත වෙත සෑම දරුවකුම යොමුකරවීම වැඩිහිටි සැමගේ යුතුකමකි. සාක්ෂරතාවෙන් ලොව ඉහළ පෙළේ රටවල් අතුරින් සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවට හිමි වන්නේ ප්‍රමුක ස්ථානයකි. ලෝකයේ දස දෙස බිහිවන නව තොරතුරු ජනතාවට ලබා දීමේදී පුස්තකාලවලට විශාල වගකීමක් පැවරී ඇත. මේ කාර්යයේදී පුස්තකාල සතු භූමිකාව අති මහත්ය. පොදු ජනතාවට පොත් ලෝකය වෙත සම්බන්ධකරලීමේ මහඟු කාර්ය පැවරී ඇත්තේ පුස්තකාල වෙතය. නවීන ලෝකයේ සෑම මිනිත්තුවකදීම ජනනය වන අති විශාල දැනුම් සම්භාරය නිසි ආකාරයෙන් සංවිධානය කර පාඨක ප්‍රජාවට දායාද කිරීම පුස්තකාලවල වගකීමකි. එසේම, පාඨක ප්‍රජාවට කියවීමට අවස්ථාව ලබා දීමත් නව තොරතුරු නිවැරදි ආකාරයට ලබා දීම තුළින් ඔවුන්ගේ දැනුම් සම්භාරය වර්ධනය කරලීම පුස්තකාල පද්ධතියේ මූලික වගකීමකි.

එන්. එච්. එම්. චිත්‍රානන්ද
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

# දේශීය ප්‍රකාශන ක්ෂේත්‍රයේ නව මං සලකුණු

*උපාලි අමරසිරි, අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා විද්‍යාපන විද්‍යා ආයතනය සභාපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හා දකුණු ආසියානු පුස්තකාල සංගම් සංවිධානය*

2003 ජූලි මස දකුණු අප්‍රිකාවේ ඩර්බන් නගරයේ පැවති අන්තර්ජාතික පාසල් පුස්තකාල සංගම් සංවිධානයේ වාර්ෂික රැස්වීම හා එහිදී අවධාරණය වූ ජාතික කියවීමේ උත්සව සංවිධාන වැඩපිළිවෙළ ශ්‍රී ලංකාවේ ජාතික කියවීමේ මාසය ප්‍රකාශයට පත්කිරීමට ආසන්න හේතු සාධකය විය. කියවීමට අදාළව විශේෂ දින, සති, මාසයක් නම් කිරීමේ වැදගත්කම කාලයක සිට දේශීය පුස්තකාල, ප්‍රකාශන, පාඨක ආදී ක්ෂේත්‍රවල සාකච්ඡාවට ලක්ව තිබූ කරුණක් විය. උක්ත සමුළුවට ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාතික විද්‍යා පදනමේ සහාය ඇතිව සහභාගිවීමේ අවස්ථාව මා හට හිමි විය. එම සමුළුව පිළිබඳ වාර්තාව සමග ජාතික කියවීමේ මාසයක් නම් කිරීමේ වැදගත්කම, පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට ඉදිරිපත් කළ විට එවකට එහි සභාපති වශයෙන් කටයුතු කළ මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලය එය එකහෙලා අනුමත කරන ලදී. මේ සඳහා සුදුසු මාසය ලෙස ඔක්තෝබර් මාසය නම් කිරීම තරමක දීර්ඝ සාකච්ඡා මාලාවකට පසු තීරණය විය. සැප්තැම්බර් සාහිත්‍ය මාසය වීමත්, ඒ මාසය තුළ කොළඹ අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය පැවැත්වීමත්, මෙහිදී බලපෑ ඇතැම් කරුණු වූ බව මතකය.

පසුව 2004 වසරේ පුස්තකාල මණ්ඩලය සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ පැවති කාලයේ දී එවකට එහි සභාපති ආචාර්ය ඩබ්.ඒ අබේසිංහ හා අමාත්‍ය විජිත හේරත් මහත්වරුන්ගේ උනන්දුවෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් ඔක්තෝබර් ජාතික කියවීම් මාසය ලෙස නිල වශයෙන් නම් කරන ලදී.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පසුගිය දශක කිහිපයේ තම කීර්තිමත් ඉතිහාසය තුළ ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ සංවර්ධන සහ ප්‍රකාශන ක්ෂේත්‍රයට අනුපමය මෙහෙවරක් සිදුකොට ඇත. සංසන්දනාත්මකව සලකා බැලීමේදී එමගින් ප්‍රකාශන ක්ෂේත්‍රයට සදු වූ සේවය වෙනත් කිසිදු රාජ්‍ය ආයතනයකින් පසුගිය අඩසියවස තුළ සිදුවී නොමැත.

ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය මණ්ඩලයේ ප්‍රධාන ලේඛකාධාර ව්‍යාපෘතිය වේ. 1984 වසරේ එවකට මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළ සුගුණදාස අතුකෝරල මහතාගේ අදහසකට අනුව මෙම ඓතිහාසික ව්‍යාපෘතිය ආරම්භ විය. තම අත්පිටපත් මුද්‍රණය සඳහා ප්‍රකාශන සමාගම්වල සහාය ලබාගැනීම අතිශයින්ම දුෂ්කරව පැවති යුගයක මෙම ව්‍යාපෘතිය ලේඛකයනට ඉමහත් ආශිර්වාදයක් විය. කතුවරුන්ගෙන් අත්පිටපත්

ලබාගෙන, උසස් අත්පිටපත් එක් වරම පිළිගෙන, සැලකිය යුතු උසස් තත්වයක ඇති අත්පිටපත් අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වියතුන් දෙදෙනකු ලවා පරීක්ෂා කොට, එහි ඇති දුර්වලතා හා ඒවා මගහැරීම පිළිබඳව උපදෙස් සහිත වාර්තා කතුවරයාට ලබාදී, එම අත් පිටපත්වල ගුණාත්මක බව උසස්කොට ප්‍රකාශනය සඳහා අනුග්‍රහය ලබාදෙන ලදී. අනතුරුව අත්පිටපත උසස්ම ආකාරයෙන් මුද්‍රණය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදය හා ග්‍රන්ථ සැලැස්ම පිළිබඳ මණ්ඩලයේ මුද්‍රණ උපදේශක කමිටුව විසින් කතුවරයාට උපදෙස් ලබාදේ. මුලදී එක් ග්‍රන්ථයක් සඳහා රු.25,000 ක් ද පසුව ක්‍රමයෙන් රු.100,000 ක් දක්වා මුදලක් ද ප්‍රකාශන අනුග්‍රහ ලෙස ලබාදෙන ලදී. මේ ව්‍යාපෘතිය යටතේ 1984 - 2008 කාලය තුළ ප්‍රකාශයට පත්වූ 2000 කට අධික ග්‍රන්ථ සම්භාරය එහි සාර්ථකත්වය කියාපායි.

මෙම ව්‍යාපෘතිය මගින් ලේඛකයනට පහත සඳහන් වාසි අත් විය.

(අ) තම අත්පිටපතේ ගුණාත්මක බව වර්ධනය කර ගැනීම සඳහා විශේෂඥ උපදෙස් ලැබීම හා ඒ මගින් වඩා හොඳ ග්‍රන්ථ පළ කිරීමට අවස්ථාව ලැබීම
(ආ) නියමිත ප්‍රමිතීන්ට අනුව මුද්‍රණය සඳහා ග්‍රන්ථ සැලැස්ම හා මුද්‍රණ උපදෙස් ලැබීම
(ඇ) ප්‍රකාශනය සඳහා වැය වන පිරිවැයෙන් සැලකියයුතු ප්‍රමාණයකට මූල්‍ය ආධාර ලැබීම

මෙම ව්‍යාපෘතිය පසුගිය දශක දෙකහමාර තුළ ශ්‍රී ලංකාවේ සිදුවූ ප්‍රකාශන විප්ලවයේ පෙර ගමන් කරු විය මේ නිසා ග්‍රන්ථ ප්‍රකාශනය තවදුරටත් ප්‍රකාශන සමාගම් කීපයක ඒකාධිකාරයක් නොවීය. ඒ මගින් ලේඛකයාට ප්‍රකාශන ක්ෂේත්‍රයේ මෙතෙක් නොතිබූ කේවල් කිරීමේ හැකියාවක් සහ යහපත් ප්‍රතිරූපයක් හිමිවිය. ලේඛකයාගේ ප්‍රතිරූපයට මෙතෙක් බරපතල හානි කළ
(i) අත්පිටපතේ දුබලතා
(ii) මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පැවති අල්ප දැනුම
(iii) අවශ්‍ය මූලික ප්‍රාග්ධනය හිඟකම

යන බාධක අභිබවා යාමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය උර දුනි. දැන් ප්‍රකාශකයා වෙත පියනගනුයේ ආත්ම විශ්වාසයෙන් හෙබි, උසස් මට්ටමේ අත්පිටපතක් සහිත, ප්‍රකාශනයට අවශ්‍ය මුළු මුදල හෝ ඉන් සැලකියයුතු ප්‍රතිශතයක් දරන බවට මණ්ඩලයේ සහතිකය රැගත් හිස කෙලින් තබාගත් ලේඛකයෙකි. තම අත්පිටපත රැගෙන ප්‍රකාශකයන් ඉදිරියේ බැගෑපත්වන, ඇතැම්විට වසර ගණනාවක් තමා භාරදුන් අත්පිටපත පිළිබඳ තොරතුරක් නොලද, කලාතුරකින් ප්‍රකාශයට පත් කළද එයද බොහෝ විට ප්‍රකාශකයාටම වාසි සහගත කොන්දේසි මත සිදුවූ යුගයේ අවසානය මෙම ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය සටහන් කරන ලදී.

බැලූ බැල්මට ව්‍යාපෘතිය සරල කාර්යයක් ලෙස පෙනුනද ඒ පිටුපස මණ්ඩලයේ නිලධාරීන් ඉටුකළ සංකීර්ණ හා අතිශය වෙහෙසකාරී කාර්ය භාරයක් තිබුණි. හොඳ අත්පිටපත් 100ක් තෝරා ගැනීමට අත්පිටපත් 300ක් 500ක් අතර ප්‍රමාණයක් සමීක්ෂණය කළ යුතුවිය. සමීක්ෂණ වාර්තා ලබා ගැනීම මෙම ව්‍යාපෘතියේ වඩාත් අභියෝගාත්මක අංශය විය. ඇතැම් ක්ෂේත්‍ර සඳහා විද්වතුන් සොයා ගැනීම,වාර්තා ඉක්මනින් ලබා ගැනීම, දුර්වල වාර්තා නිසා මතුවන ගැටලු, පරස්පර විරෝධී තත්වයන් මතු වූ විට තෙවැනි වාර්තාවක් ලබා ගැනීම, උපදේශක කමිටු කැඳවීම, තරමක් පමා වූ හෝ ප්‍රතික්ෂේප වූ අවස්ථාවල ලේඛකයන්ගේ වාග් ප්‍රහාරයනට මුහුණ දීම නිලධාරීන් මුහුණ පාන ගැටලු විය. ප්‍රකාශන ව්‍යාපෘතියේ අත්පිටපත් සමීක්ෂණය ඇතැම් විට ප්‍රමාදවීම, ඇතැම් ලේඛකයන් සමීක්ෂණ වාර්තා සමග එකඟ නොවීම වැනි විවේචන තිබුණද සමස්තයක් ලෙස එය රාජ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් සිදුකළ උසස් මට්ටමේ ව්‍යාපෘතියක් ලෙස පොදු පිළිගැනීමක් විය. ඥාති සංග්‍රහය, අල්ලස වැනි රාජ්‍ය ක්ෂේත්‍රයේ සාමාන්‍යයෙන් දක්නට ලැබෙන දුබලතා පිළිබඳ චෝදනා මෙයට කිසිදා එල්ල නොවුණි. වරක් ගත් කතුවරයෙකු සම්මන්ත්‍රණයකදී ප්‍රකාශ කළේ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ අභිමානය රැකගත් උතුම් ව්‍යාපෘතියක් බවයි. දැනට සේවය කරන හා මුලදී සේවය කළ නිලධාරීන් රාශියකට මෙහි ගෞරවය හිමිවන අතර දිගු කලක් ප්‍රකාශන නිලධාරී ලෙස කටයුතු කළ නෙල්සන් පීරිස් මහතාගේ දායකත්වය මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වේ.

නව ප්‍රකාශන රැසක් පළ කිරීමට දුන් දායකත්වයට අමතරව මෙම ව්‍යාපෘතිය මගින් වක්‍රව සිදුකළ මෙහෙයද අති විශාල වේ. බොහෝ ලේඛකයින් තම ප්‍රකාශනවල සඳහන් කර ඇති පරිදි ඔවුන්ගේ පසුකාලීන සාර්ථක ලේඛක දිවියට පදනම වැටුනේ මෙම ව්‍යාපෘතියෙනි. ප්‍රකාශන හා මුද්‍රණ ප්‍රමිති පිළිබඳ මණ්ඩලයේ ස්ථාවරයද මෙහිදී සමස්ත ප්‍රකාශන ක්ෂේත්‍රය කෙරෙහි විශාල බලපෑමක් කරන ලදී. කලකට පෙර විශාල ප්‍රකාශන සමාගම්වල ග්‍රන්ථ සැලැස්ම හා ප්‍රකාශන ප්‍රමිති පිළිබඳ විශේෂඥයින් අතලොස්සකට මෙම දැනුම සීමා විය. මණ්ඩලය තමන් වෙත පැමිණි සියලුම ලේඛකයින්ට මෙම දැනුම සම්මන්ත්‍රණ, උපදේශන හා ප්‍රකාශන මගින් ලබා දුනි. මෙහිදී හිටපු සභාපතිවරයෙකු වූ හෙන්රි සමරනායක මහතාගෙන් විශිෂ්ට දායකත්වයක් ලැබුණි. කඩදාසිවල ස්වභාවය, අකුරුවල ප්‍රමාණය, ග්‍රන්ථ සැකැස්ම, පිටු සැකැස්ම, කවර සැකැස්ම, පොත් බැඳීම ආදී සියල්ල පිළිබඳ මණ්ඩලය තම ප්‍රකාශනවලට අනිවාර්ය කළ ප්‍රමිතීන් ද ක්‍රමයෙන් සමාජයේ සියලුම දෙනා පිළිගත් පොදු ප්‍රමිති බවට පත්විය.

මෙහි අනෙක් ප්‍රතිඵලය ප්‍රකාශන ක්ෂේත්‍රය වඩාත් ප්‍රජාතන්ත්‍රීය වීම වේ. ප්‍රකාශකයින් තවදුරටත් ඒකාධිපතීන් ලෙස ක්‍රියා නොකළ අතර හොඳ අත් පිටපත් ලබා ගැනීම සඳහා ඔවුන් අතර යම් ප්‍රමාණයක තරඟයක්ද දක්නට ලැබුණි. ලේඛකයින්ට විධිමත් ලෙස කර්තෘ භාගය ලැබුනි. මණ්ඩලයෙන් ලැබුණ තාක්ෂණික මගපෙන්වීමත්, නව තොරතුරු තාක්ෂණය හේතුවෙන් ග්‍රන්ථ මුද්‍රණය පහසු කාර්යයක් වීමත් නිසා ඇතැම් ලේඛකයින්

තම පොත් තමන්ම ප්‍රකාශයට පත් කිරීම හෝ කුඩා ප්‍රකාශන සමාගම් ඇරඹීමක්ද දක්නට ලැබුණි. ග්‍රන්ථ අලෙවි කිරීමේදී මණ්ඩලයේ අනුග්‍රහයෙන් ප්‍රකාශය වූ බව සඳහන්ව තිබීම විශේෂ වාසි සහගත තත්වයක් විය.

මෙම ව්‍යාපෘතිය නිසා විශාල වාසි සහගත තත්වයද මෙහිදී සඳහන් කළයුතු වේ. මෙම ප්‍රකාශන ආධාර ලෙස කතුවරයාට ලබා දෙන මුදල වෙනුවෙන් මණ්ඩලය නියම කරන මිලකට පොත් ප්‍රමාණයක් මණ්ඩලයට ලබාදිය යුතු වේ. මේ අනුව ග්‍රන්ථ ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතිය මගින් ආයතනයට ලැබුණි. මෙම අතිවිශාල පොත් ප්‍රමාණය ශ්‍රී ලංකාව පුරා විශේෂයෙන්ම ආර්ථික වශයෙන් පීඩිත මහජන, පිරිවෙන්, පාසල් දෙපාර්තමේන්තු සහ වෙනත් වර්ගවල පුස්තකාල අතර නොමිලේ බෙදා හරින ලදී. පසු ගිය සමයේ බොහෝ මහජන, පාසල්, පිරිවෙන් හා වෙනත් කුඩා පුස්තකාලවලට පොත් පත් ලැබුණ එක් ප්‍රධාන මාර්ගයක් වූයේ මණ්ඩලයෙන් නොමිලයේ ලැබුණු පොත් ආධාර වේ. මෑතකදී සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් විමල් රූබසිංහ මහතා සඳහන් කළේ තමා ප්‍රාදේශීය ලේකම්වරයකු ලෙස දකුණු පළාතේ සේවය කරන සමයේ පුස්තකාල මණ්ඩලයේ පොත් ආධාර ලබා ගෙන ග්‍රාමීය පුස්තකාල විශාල ප්‍රමාණයක් දියුණු කළ බවයි. බිම් මට්ටමේ දේශපාලන හා පරිපාලන නිලධාරීන්, ආයතන ප්‍රධානීන්, පුස්තකාලයාධිපතීන් නිරතුරු පොත් ආධාර පතා මණ්ඩලයට පැමිණීම තවමත් සුලබ සිදුවීමකි.

වෙනත් දායකත්වයන්

ඉහත සඳහන් ග්‍රන්ථ ප්‍රකාශන ආධාර ව්‍යාපෘතියට අමතරව තවත් ව්‍යාපෘතීන් ගණනා-වක් මගින් පුස්තකාල මණ්ඩලය ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා සෘජුව හෝ වක්‍රව සහාය දක්වන ලදී.

(1) මුද්‍රිත ග්‍රන්ථ මිලදී ගැනීමේ ව්‍යාපෘතිය මේ යටතේ කතුවරුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන වලින් පිටපත් සංඛ්‍යාවක් මිලදීගෙන ආධාර කරන ලදී. ලබා-දෙන මුදල් ප්‍රමාණය ඒ ඒ වසරවල අයවැය ලේඛනයෙන් වෙන්කළ මුදල් ප්‍රමාණය අනුව තීරණය විය.

(2) සම්භාව්‍ය කෘති සංස්කරණය සහ ප්‍රකාශයට පත් කිරීම මේ ව්‍යාපෘතිය මගින් (අ) පන්සිය පනස් ජාතකය (ආ) මහාවංශය (ඇ) පූජාවලිය යන සම්භාව්‍ය ග්‍රන්ථ සංස්කරණය කොට පළ කරන ලදී. මෙය අතිශය වෙහෙසකර කාලය ගතවන දීර්ඝ ව්‍යාපෘතියක් විය. එසේ වුවද අතිශය සංකීර්ණ, ගැඹුරු මෙබඳු සාහිත්‍ය ව්‍යාපෘති සාර්ථකව ඉටු කිරීම ජාතික වශයෙන් මෙන්ම මණ්ඩලයේ වෘත්තීය නිපුණතාව තීව්‍ර කර ලීමටද වැදගත් විය.

(3) 20 වන සියවසේ ප්‍රකාශිත මුද්‍රණයේ නොමැති උසස් කෘති නැවත ප්‍රකාශයට පත් කිරීම.
මෙම ව්‍යාපෘතිය යටතේ දැනට මුද්‍රණයේ නොමැති කලකට පෙර අතිශයින් ජනප්‍රිය වූ රොමාගේ වාසනාව වැනි කෘති රාශියක් නැවත මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කිරීමට ආධාර කරන ලදී. අරමුදල් හිඟය නිසා පසුව මෙම ව්‍යාපෘතිය අත්හැර දැමීමට සිදු විය.

(4) ජාතික ග්‍රන්ථ විඥාපන සේවා ජාතික පුස්තකාලය මගින් දැඩි පරිශ්‍රමයකින් පළ කරනු ලබන (අ) ජාතික ග්‍රන්ථ නාමාවලිය (ආ) වාර සඟරා ලිපි අනුක්‍රමනිකාව (ඇ) පුවත්පත් ලිපි අනුක්‍රමනිකාව (ඈ) ශ්‍රී ලංකා සම්මේලන සූචිය (ඉ) පූර්වකාලීන ජාතික ග්‍රන්ථ නාමාවලිය ආදී ග්‍රන්ථ විඥාපන සේවා තම පර්යේෂණ සඳහා තොරතුරු සොයන ලේඛකයින්ට විශාල ආධාරක වේ.

(5) ජාතික පුස්තකාල විමර්ශන පහසුකම්ඃ ජාතික පුස්තකාලයේ මහල් 3ක් පුරා ඇති විමර්ශන පහසුකම් ශ්‍රී ලංකාවේ ලේඛකයින් තවමත් උපරිම ප්‍රයෝජන නොගන්නා නමුත් ඔවුනට විශාල පහසුකම් ඇති සේවාවන් වේ. පර්යේෂකයනට අවශ්‍ය අන්තර්ජාතික, ජාතික මට්ටමේ උසස් විමර්ශන ග්‍රන්ථ, අන්තර්ජාල සේවා සහ වෙනත් විමර්ශන පහසුකම් මෙහි සැපයේ.

(6) අන්තර්ජාතික ප්‍රමිති අංක ව්‍යාපෘතියඃ "ISBN" "ISSN" "ISMN" අංක ලබා දීම මණ්ඩලය සිදුකරන තවත් සේවාවකි. මේ මගින් කර්තෘන්ට හා ඔවුන්ගේ කෘතීන්ට අන්තර්ජාතික පිළිගැනීමක් ලැබුණි.

(7) ශ්‍රවණාගාර පහසුකම් ලේඛකයින්ට තම ප්‍රකාශන දොරට වැඩීම සඳහා සහ වෙනත් සම්මන්ත්‍රණ, රැස්වීම් සඳහා ජාතික පුස්තකාල ශ්‍රවණාගාරය හෝ සම්මන්ත්‍රණ ශාලාව පහසු මිලට සැපයේ. කතුවරුන් මෙම පහසුකමින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සතුටට කරුණකි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය හෙවත් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම වර්ධනය කිරීම පුස්තකාල මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වේ. මධ්‍ය පර්යේෂණ පුස්තකාලයක විවිධ ග්‍රන්ථ විඥාපන සේවා පිළිබඳ සමාජය දැනුවත්වීම විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටක සෙමෙන් සෙමෙන් සිදුවන ක්‍රියාවලියකි. මෙහිදී මෙම ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘති තුළින් ජාතික පුස්තකාලයට සුවි-ශේෂ පාඨක පිරිස් ආකර්ෂණය කරගැනීමට හැකි වීම ජාතික පුස්තකාලයේ ජයග්‍රහනයකි. ප්‍රකාශන ආධාර ලබා ගැනීමට පැමිණෙන ලේඛකයින් ක්‍රම ක්‍රමයෙන් ජාතික පුස්තකාලයේ සමස් පත් පිළිබඳවද අවධානය යොමුවීමක් දක්නට ලැබුණි. ISBN අංක ලබා ගැනීම හා ග්‍රන්ථ නාමාවලියේ තම ග්‍රන්ථය පළකර ගැනීමේ වැදගත්කම, නීතිමය තැන්පතු

ක්‍රමය යටතේ පොතේ පිටපත් තැන්පත් කිරීම ආදිය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය තීව්‍ර විය. ජාතික පුස්තකාලයේ තැන්පත් කර ඇති විමර්ශන ග්‍රන්ථ, අන්තර්ජාල පහසුකම් පරිශීලනය කිරීමට ඔවුන් ක්‍රමයෙන් පෙළඹීමක් දක්නට ලැබුණි.

**ඉදිරි පියවර**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ප්‍රකාශන ක්ෂේත්‍රයේ ඉදිරි කටයුතු සැලසුම් කිරීමේදී

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රකාශන ක්ෂේත්‍රයට එය පසුගිය දශක දෙකහමාර තුළ සිදුකළ ඓතිහාසික මෙහෙවර

(ආ) 21 වන සියවසේ දෙවන දශකයේ දී දේශිය ප්‍රකාශන ක්ෂේත්‍රය මුහුණ දෙන සුවිශේෂ අභියෝග

යන කරුණු දෙක විශේෂ සැලකිල්ලට ගත යුතුවේ.

පළමු කරුණ නිසා පොදුවේ රට තුළත් විශේෂයෙන් ලේඛකයින්, ප්‍රකාශකයින්, පාඨකයින් හා විද්වතුන් අතරත් පුස්තකාල මණ්ඩලයට සුවිශේෂ ගරු නාමයක් හා උසස් පිළිගැනීමක් ලැබී ඇත. දෙවන කරුණ වන වත්මන් සුවිශේෂ අභියෝග හඳුනා ගැනීම හා ඒවාට පිළියම් යෙදීම ප්‍රවේශමෙන් සිදු කළ යුතු කාර්යයකි. පොදුවේ සෑම අංශයකටම අනුග්‍රහය දැක්වීම වෙනුවට මෙම අනුග්‍රහය සඳහා විශේෂ අංශ තෝරා ගැනීම එක් මාර්ගයකි. දැනට රට තුළ අඩුවෙන් පළවන සුවිශේෂ විෂය ක්ෂේත්‍ර පිළිබඳ මෙහිදී විශේෂ අවධානය යොමු කළ හැක. වර්තමාන තොරතුරු තාක්ෂණ යුගයට ගැලපෙන විද්‍යුත් ප්‍රකාශන පළ කිරීමට අනුබල දීම, දේශිය උසස් ග්‍රන්ථ විදේශිය භාෂාවනට පරිවර්තනය හා උසස් විදේශීය ග්‍රන්ථ දේශීය භාෂාවකට පරිවර්තනය මෙහිදී සලකා බැලිය යුතු තවත් අංශ වේ.

ආයතනයේ වෘත්තීය මුහුණුවර ස්ථාපිත කිරීම මෙම ක්‍රියාවලියේ අතිශය වැදගත් කරුණ වේ. ජාතික පුස්තකාලය හා ජාතික පුස්තකාල සේවා අන්තර්ජාතිකව පිළිගත් සුවිශේෂ වෘත්තීය ක්ෂේත්‍රයක් වේ. බොහෝ අවස්ථාවල බාහිරව ආයතනයේ කටයුතුවලට සම්බන්ධවන අයට මෙම වෘත්තීය ක්ෂේත්‍රයේ වැදගත්කම අවබෝධ කර ගැනීමට කාලයක් ගත වේ.ආයතනයේ ප්‍රධාන කාර්යය ජාතික පුස්තකාලය පවත්වාගෙන යාම හා ජාතික පුස්තකාල පද්ධතියේ මධ්‍ය ආයතනය ලෙස සමස්ත පුස්තකාල පද්ධතිය මනාව පවත්වාගෙන යාමට ආධාර කරලීම වේ. මෙය ආයතනයේ සියලුම ප්‍රවනතාවලද, සැලසුම්වල තේමාව විය යුතු වේ. ආයතනයේ වෘත්තිකයන් මෙන්ම සහාය කාර්යමණ්ඩලයෙන් 95 ක ප්‍රමාණයක් පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තිකයන් වේ.

ග්‍රන්ථ සංවර්ධන හා ප්‍රකාශන ආධාර ව්‍යාපෘති අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ පුස්තකාල පද්ධතියට අවශ්‍ය උසස් පුස්තකාල ද්‍රව්‍ය සැපයීමට ආධාර වන ව්‍යාපෘති වේ. ඒ නිසා ඒවා වැදගත් වුවද පුස්තකාල වෘත්තිකයන් ලෙස තොරතුරු ප්‍රචාරණය, ග්‍රන්ථ විඥාපන සේවා, ප්‍රලේඛන සේවා, ග්‍රන්ථ විඥාපන සේවා, නව තාක්ෂණය පුස්තකාලයේ විවිධ කාර්ය සඳහා යොදා ගැනීම වැනි පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අදාළ කාර්යයන් රාශියක් ඔවුන් වෙත පැවරී ඇත. මේ පිළිබඳ මනා අවබෝධයකින් කළමනාකරණ කටයුතු කිරීම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රකාශන ක්ෂේත්‍රය මෙන්ම පුස්තකාල තොරතුරු සේවා වර්ධනය සඳහා නිදහසින් පසු දැවැන්ත කාර්ය භාරයක් සිදු කල ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මෙම සුවිශේෂී ව්‍යාපෘතිය ජාතික මට්ටමින් නිසි ඇගයීමකට ලක් වූ බවක් නොපෙනේ. එසේ වුවද එයින් සහනයක් ලැබූ කතුවරුන් සිය ගණනක් තම කෘතිවල සිත් කාවදින රමණීය බසින් එය අගය කර ඇත. එම ග්‍රන්ථ පරිහරණය කරන ලක්ෂ සංඛ්‍යාත පාඨක ජනතාව ඒ මගින් උසස් වින්දනයක් මෙන්ම දැනුම් සම්භාරයක් ලබා ගෙන ඇත. ඔවුන් විවිධ ක්ෂේත්‍රවලින් දැනුම පෝෂණය සඳහාද, ජාතික සංවර්ධනය සඳහාද දායක වනු ඇත. එය මෙම ජාතික ආයතනයට ලැබිය හැකි උතුම්ම සම්මානය වේ.

## කියවීම සංවර්ධනයට මාවතයි

*මහාචාර්ය ඩබ්. ඒ. වීරසූරිය, අංශ ප්‍රධාන, පුස්තකාල හා විඥාපන විද්‍යා අංශය*
*කැලණිය විශ්වවිද්‍යාලය*

අද පිළිගත් සත්‍යයක් වන්නේ " දැනුම " රටක සංවර්ධනය සඳහා උපයෝගී කරගතහැකි ප්‍රධාන සම්පතක් වන බවයි. සාම්ප්‍රදායික ආර්ථික විද්‍යාත්මක වර්ගීකරණය අනුව රටක හෝ ආයතනයක අභිවෘද්ධිය සඳහා උපයෝගී කරගන්නා මූලික සම්පත් ලෙස " භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසාය " හඳුන්වනු ලබයි. වර්තමානයේ කළමනාකරණ සම්ප්‍රදාය මඟින් දැනුම, තොරතුරු සහ දත්ත, මතු කී සම්පත්වලට වඩා වටිනා මෙහෙයක් රටක, ආයතනයක හෝ පවුල් ඒකකයක සංවර්ධනය උදෙසා උපයෝගී වන බව ඔප්පු කර ඇත. නූතන ලෝකයේ බටහිර රටවල් ඇතුළු පෙරදිග ජපානය, සිංග ප්පූරුව මෙන්ම නැගී එන චීනය, ඉන්දියාව වැනි රටවල වර්ධනයට මුල් වූ ප්‍රධාන හේතුව ලෙස රටවල නව දැනුම උත්පාදනය, මනා තොරතුරු කළමනාකරණය හා සංවිධානය, තොරතුරු නිවැරදිව භාවිත කිරීම සහ දැනුම් සමාජයකට අවශ්‍ය යටිතල පහසුකම සහ ක්‍රියාමාර්ග ගැනීමට ඉවහල්ව ඇතිබව විද්‍යමානය.

මේ අනුව දැනුම් සමාජයක් සකස් වීමට තොරතුරු අවශ්‍ය වේ. නිවැරදි තොරතුරු මොනවාද, එම තොරතුරු සංවිධානය හා කළමනාකරණය කරන්නේ කෙසේද, ඒවා භාවිත කරන්නේ කෙසේද යන කරුණු පසුබිමෙහි සැඟව ඇති වචන අතර භාෂාව, දත්ත, කියවීම සහ දත්ත කළමනාකරණය ප්‍රමුඛ වේ. තවද දැනුම් කර්මාන්ත " Knowledge Industries " යන්න අනෙකුත් කර්මාන්තවලට වඩා අද ඉදිරියෙන් සිටී.

දැනුම් කර්මාන්තයේ උන්නතිය සඳහා කියවන පිරිස්වලින් මහත් දායකත්වයක් ලැබී ඇත. ශාස්ත්‍ර, ශිල්ප කලා හා විද්‍යාවන් ඉගෙනගන්නා පිරිස්, ඒවා උගන්වන පිරිස්, ඒවා ලොවට ජනිත කරවන ලේඛක ප්‍රජාව, විෂය දැනුම පිළිබඳ ප්‍රාමාණික විද්‍යාඥයින්, විද්‍යා, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර ආදී විෂයයන්වල නව දැනුම් ලොවට බිහිකරන විද්වත් කණ්ඩායම් දැනුම්, කර්මාන්තයට අයත්ය. කියවන ප්‍රජාව ( Reading Communities ) ලෙස හඳුන්වා දිය හැකිය.

වර්තමානයේ ඇති දැනුම් මූලාශ්‍ර දැනුම් බහාලුම්, ඒවා ලේඛනමය, මුද්‍රිතමය හෝ මාර්ගගත ප්‍රවේශී දත්ත පදනම්, අන්තර්ජාල වෙබ් අඩවි, අතත්‍ය පුස්තකාල, විද්‍යුත් සහ සංඛ්‍යාංක පුස්තකාල ( Electronic and Digital Libraries) ආදී කුමන ස්වරූපයෙන් ගොඩනගා තිබුණද ඒවායේ අන්තර්ගතයන් සැකසූවන් වන්නේ ඉහත සඳහන් කළ දැනුම් කර්මාන්තයට අයත් කියවන ප්‍රජාවයි.

## ශ්‍රී ලංකාව, කියවන ප්‍රජාව සහ සංවර්ධනය

ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවත්නා රටකි. නව සහස්‍රයේ ඉලක්ක කාලීනව ඉටුකර ගැනීම කඩිනම් සංවර්ධනයට මාවතකි. වර්තමානයේ අවධානයට ලක්ව ඇති සංවර්ධනය ඉලක්ක කරගත් පංච විධ මූලෝපායන් සඳහාද දැනුම හා තොරතුරු සම්පතක් වශයෙන් අත්‍යවශ්‍ය වේ. සංවර්ධනයෙහි ලා දැනුම ඇති, දැනුමින් පරිපූර්ණ සමාජයක් යන්නෙහි මූලික අදහස වන්නේ රටක කියවන ප්‍රජාවගේ ශක්තිය ඔවුන්ගේ නොමසුරු-දායකත්වයයි.

ශ්‍රී ලංකාවේ "කියවන ප්‍රජාව" සමන්විත වන්නේ ප්‍රාථමික අධ්‍යාපනය, ද්විතීය, තෘතීය සහ උසස් අධ්‍යාපනය, අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනයට සම්බන්ධ පිරිස්ය. මෙම ප්‍රජාවගේ කියවීම හා දැනුම සංවර්ධනය සඳහා ප්‍රමුඛතම උපායමාර්ගයක් වන්නේ යහපත් පුස්තකාල පද්ධතියක් නිර්මාණය කර පවත්වාගෙන යාමයි. එහෙත් ශ්‍රී ලංකාව වැනි රටක තවමත් පුස්තකාල සඳහා අඩු අවධානයක් පවතින අතර පුස්තකාල සම්බන්ධ මව් ආයතනය, බලධාරීන් නිලතන්ත්‍රය, පුස්තකාල කෙරෙහි නිසි අවධානයක් යොමු කර නැත. එහෙත් ඉන්දියාවේ ජාතික දැනුම් කොමිසම ( National Knowledge Commission, India), එක්සත් රාජධානියේ පුස්තකාල සහ විඥාපන කොමිෂම (Library and Information Commission),එක්සත් රාජධානියේ කෞතුකාගාර, පුස්තකාල සහ ලේඛනාගාර මණ්ඩලය (The Museums, Libraries and Archives Council), ඇමරිකා එක්සත් ජනපදයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික කොමිෂම (National Commission on Libraries and Information Services), සහ නවසීලන්ත පුස්තකාල හා විඥාපන උපදේශක කොමිෂම ( Newzealand Library and Information Commission) වැනි ආයතනවලින් දැක්වෙන ආදර්ශය වන්නේ එම ආයතන අයත් රටවල් තම පුස්තකාල සම්බන්ධව දරන ආකල්ප හා කැපවීමයි.

ශ්‍රී ලංකාව තුළ කියවීම වර්ධනය සඳහා පියවර ගැනීමේදී පුස්තකාලයාධිපතීන් හා අදාල බලධරයන් අංශ දෙකක් සම්බන්ධව අවධානය යොමුකළ යුතුය.

I පාඨකයා සංවර්ධනය (Reader Development)
II කියවීම් ප්‍රවර්ධනය (Reading Promotion)

පාඨකයා සංවර්ධනය කිරීම යනු පුද්ගලයා ඉලක්ක කර ගනිමින් ඔහු හෝ ඇය තුළ කියවීමේ ශක්තිය ප්‍රගුණ කරවීමයි. එය පාඨක මූල (Reader Oriented) ක්‍රමය වශයෙන් හැඳින්විය හැකිය. කියවීම් ප්‍රවර්ධනය යනු සමස්ත ප්‍රජාව හෝ අදාළ පාඨක කණ්ඩායම් එල්ලකර ඔවුන් තුළ කියවීමේ හැකියාව වර්ධනය සඳහා ක්‍රියාකාරකම් සහ වැඩසටහන් පැවැත්වීම අපේක්ෂිතය. මෙහි දෙවැනි අංශය සමාජ මූල (Socio - Centred) ප්‍රජා මූලක්‍රමය (Community Centred) වශයෙන් නිර්වචනය කළ හැකිය. බටහිර රටවල්

මෙහි පළමු අංශය එනම් (Reader Centred) ක්‍රමය භාවිතයට ගෙන ඇති අතර, දියුණු වෙමින් පවත්නා ආසියාතික රටවලට ඉතා වැදගත් වන්නේ මෙම ආකෘති දෙකෙහිම මිශ්‍රණයක් සහ දෙවැනි ආකෘතිය වූ සමාජ මූලික ක්‍රමයට වැඩි ස්ථානයන් ලබා දෙන ක්‍රමයක් ස්ථාපිත කිරීමයි.

## ශ්‍රී ලංකාවේ කියවීම ප්‍රවර්ධනයෙහි දායක පාර්ශව

1 දෙමාපියන්
2 පවුල
3 ඒ ඒ පුද්ගලයන්
4 ශිෂ්‍ය ප්‍රජාව
5 ගුරුවරුන් හා පාසැල්
6 පුස්තකාලාධිපතිවරු සහ පුස්තකාල
7 කර්තෘවරු සහ ප්‍රකාශන ප්‍රජාව
8 රජය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
9 නිලධරයන්
10 අධ්‍යාපන බලධාරීන් හා ආයතන
11 විද්වත් වෘත්තීක සංවිධාන හා ආයතන
12 ආගමික ආයතන
13 රාජ්‍ය නොවන සංවිධාන
විදේශීය ආයතන සහ
සහායක පාර්ශව

කියවීම් ප්‍රවර්ධනයෙහි ලා පුස්තකාලවල දායකත්වය සහ වැඩසටහන්

- ළමා පුස්තකාල ක්‍රමය දියත් කිරීම
- පාසැල් පුස්තකාල සමග සහයෝගීතා වැඩසටහන්
- පුස්තකාලවලට ග්‍රන්ථ කර්තෘවරුන් ගෙන්වා කරන වැඩසටහන්
- ත්‍යාග ප්‍රදාන මගින් කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම
- පාඨක සමාජ
- කථාන්දර පැය
- ග්‍රන්ථ විවේචන ක්‍රම
- පොත් ප්‍රදර්ශන ක්‍රමය
- පොත් අලෙවිහලක් පවත්වාගෙය යාම
- පොත් සල්පිල් පැවැත්වීම
- උත්සව සංවිධානය
- තරඟ සහ නිර්මාණ සංදර්ශනය

* පාසැල් විෂය මාලාව යොදා ගැනීම
* පාඨක වර්ග ක්‍රමය
* ගුරු පුහුණු වැඩසටහන්
* දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන්
* පුස්තකාල උපදේශනය (Library Advocacy)

## කියවීමේ පරමාර්ථ සහ සංවර්ධනය

කියවීමේ පරමාර්ථ සහ කියවන සමාජයක් බිහිකරලීමෙන් ලැබෙන ප්‍රයෝජන විග්‍රහ කිරීමේදී කියවීම සහ සංවර්ධනය අතර දැඩි සම්බන්ධතාවක් තිබෙන බව පැහැදිලිය. කියවීමේ ප්‍රතිඵල මැනීම පුස්තකාලවලින් රටක සංවර්ධනයට කොතෙක් දුරට දායකත්වයක් ලැබුණද යන්න නිරීක්ෂණයට ලක් කිරීම, පර්යේෂණයට ලක් කිරීම මෙන් දුෂ්කර කරුණකි. පහත දැක්වෙන කියවීමේ පරමාර්ථ තුළින් කියවීම කොතෙක් දුරට සංවර්ධනයට දායකත්වයන් ලබා දෙන්නේදැයි පැහැදිලි වේ.

## කියවීමේ පරමාර්ථ

* විනයගරුක පුරවැසියන් බිහිකරලීම
* දැනුමින් පිරිපුන් ප්‍රජාවක් බිහිකරලීම
* ඉගෙනුම් සමාජයකට ප්‍රබල පිටිවහලක් වීම
* දැනුම් සමාජයට ස්ථාවර මාර්ගයක් ඇති කිරීම
* ගැටළු අවම සමාජයක් (උදා: හිස් බන්ධනාගාර)
* නිර්මාණශීලි සහ නව නිපැයුම් තනන පුරවැසියන්
* මාර්ටින් වික්‍රමසිංහ, විලියම් ෂේක්ස්පියර් වැන්නන් බිහිකරලීම
* ගුණාත්මක අධ්‍යාපනයක්
* පාරිභෝගික මූල සමාජයක් වෙනුවට නිෂ්පාදන මූලික සමාජයක්
* ආනයන මූලික සමාජයක් වෙනුවට අපනයන මූලික සමාජයක්
* රටම කියවීම් සමාජයක්
* කියවීම් සංස්කෘතියක්
* ජාතික අභිමානයට මඟක්

ඉහත කරුණු අනුව කියවීමේ සමාජයක් තුළින් රටක සංවර්ධනයට කෙබඳු දායකත්වයක් ලබා දෙන්නේද යන්න මොනවට පැහැදිලිය. එබැවින් කියවීම් ප්‍රවර්ධනයෙහි ලා සියලුම පාර්ශවකරුවන් එකට එක්විය යුතුය.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ කියවීම් ප්‍රවර්ධනයෙහි ලා අදාළ සියලුම පාර්ශව එකට එක්ව වැඩකටයුතු කළ යුතු කාලය එළඹී ඇත. ඉන්දියාවේ දැනුම් කොමිෂම ආදර්ශයට

ගනිමින් ශ්‍රී ලංකාව තුළද ජාතික පුස්තකාල හා තොරතුරු කොමිෂමක් හෝ ස්ථාවර ආයතනයක් ස්ථාපිත කිරීමේ කාලය උදාවී ඇත.

විමර්ශන


1 Babe R. E. (1994) The place of information in economic. In : Information and communication in economics, Rober E. Babe (ed). Boston : kluwer Academic Publishers, 41 - 68.pp

2 Organization for Economic cooperation and Development (1986) Trends in the information economy, Paris : OECD, 42pp. CICCP Services, No.11

3 Beanmont, J. and Sutherland, Ewan (1992) Information resource management : management in our knowledge - based society and economy. Oxford : Butterworth Heinemun, 309p.

4 Millennim Development. Goals Available from : http://www.mdg.lk/inpages/thegoals/mgds_in_srilanka. Shtml(Accessed on 10 th Oct 2011)

5 Reports and Recommendation. Available from : http://www.knowledgecommission.gov.in (Accessed on 9th Oct 2011)


A Picture is worth 10,000 words?
His eyes and ears are turned off and tuned out.
While someone is trying to show him a TV commercial.
When he's looking at a magazine, holding it, turning pages,
stopping when and where he wants to, he is participating.
Print advertising doesn't simply happen *to* you.
Print happens *with* you. Think print.
Brought to you by the
MAGAZINE PUBLISHERS ASSOCIATION OF ASIA

පසු ගිය දිනක පැරණි ඩයිජෙස්ට් සඟරා ගොන්නක් පෙරළමින් සිටින විට ඉහත දැක්වූ රූපය සහිත වෙළඳ දැන්වීම නෙත ගැටිණි. එම පිටුව සඟරාවෙන් ගැලවී තිබුණ නිසා, පළ වූ වසර හරි හැටි කිව නොහැකිය. එහෙත් මා කියවමින් සිටි බොහෝ සඟරා පනහ දශකයෙන් පසුව, නමුත් අසූවට පෙර පළ වූ ඒවාය. ඒ නිසා මෙය 60 හෝ 70 දශකය තුළ ප්‍රකාශයට පත් කළ වෙළඳ දැන්වීමක් විය යුතුය. එනම් රූපවාහිනිය සිය යුරෝපීය උපන් බිම්වලින් එපිට, දකුණු ආසියාව හා ඈත පෙරදිග දක්වා පැතිරුණු සමයයි.

සාරාංශය ගත්විට එම දැන්වීමෙන් කියවෙන්නේ රූපවාහිනිය"දකිනවා" වුවත් පොතක් හෝ සඟරාවක් "බැලිය හැකි" බව යි. එනිසා මුද්‍රිත සඟරාව වඩා ප්‍රයෝජනවත් බව ආසියානු සඟරා ප්‍රකාශකයන්ගේ සංගමය පාඨකයාට "ඇඟිල්ලෙන් ඇන" දන්වා සිටී. එහෙත් මෙහි යටි අර්ථය වන්නේ එකල රූපවාහිනී මාධ්‍යයේ ආගමනය පිළිබඳව සඟරා ප්‍රකාශකයන් බිය වූ බවය. වෙළඳ දැන්වීම් පළ කරමින් පාඨකයා රඳවා ගැනීමට තරම් එම බිය බලවත් විය. එහෙත්, සඟරා, පොත්පත් වලින් සහමුලින් පාඨකයා උදුරා දමන්නට තරම් එදා රූපවාහිනියවත් අද අන්තර්ජාලයවත් සමත් නොවූ බව, අපි අද මේ මොහොතේ දනිමු.

කෙසේ වෙතත්, නව තොරතුරු මාධ්‍යවලින් පාඨක ජනතාව වෙත කරුණු දැන්වීම බලවත් බව පිළිගත යුතුය. මෙම ලිපියේ අරමුණ, එ දා කියවීම හා අද කියවීම අතර වෙනස පිළිබඳ විශ්ලේෂණයක යෙදීම යි.

ඉලෙක්ට්‍රෝනික මාධ්‍යයන්හි පැතිරීමට හේතු වූ ප්‍රධාන කරුණ වනුයේ නිෂ්පාදන වියදම අවම වීමයි.පරිගණක පෞද්ගලික වීමත් සමග, ලේඛනයක් නිර්මාණය කිරීම ඉතා පහසු කටයුත්තක් බවට පත් විය. තනි පුද්ගලයා ලේඛකයා මෙන්ම ප්‍රකාශකයා බවටද පහසුවෙන් පත්වීමේ හැකියාව අද තිබේ.

නවීන තොරතුරු මාධ්‍ය තවත් දියුණු වන විට සිදුවූ අනෙක් වෙනස් කම නම්, ඒවා වඩාත් පහසුවෙන් අතේ ගෙන යා හැකි (Portable) වීමයි. ජංගම දුරකථන එහි මුල් අරමුණ වූ දුර කථන කටයුත්තට අමතරව තොරතුරු උකහා ගන්නා මාධ්‍යක් ලෙසද පරිණාමය වී තිබේ. මීට අමතරව iPad හා ඩිජිටල් පොත් කියවන (digital book reader) කියවීමේ හා තොරතුරු ලබා දීමේ මාධ්‍ය ලෙසම විශේෂණය වී ඇත.

ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයේ පැතිරීම වේගවත්ය. ශ්‍රී ලංකාවේද ගම් නියම්ගම් කරා ඒවා පිය ඔසවා තිබේ. දැනටමත් අන්තර්ජාල වෙබ් පිටු අතර තොරතුරු විශාල ප්‍රමාණයක් ඇත. ස්වභාෂාවලින් ඇති තොරතුරු ප්‍රමාණයද ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. විනොදාශ්වාදය, අධ්‍යාපනය හා පර්යේෂණ යන කුමන ක්ෂේත්‍රයක් පිළිබඳ වුවද ප්‍රාමාණික තොරතුරු මුදල් ගෙවා මෙන්ම නොගෙවාද ලබා ගැනීමේ හැකියාව ඇත. පහත දැක්වෙන සාම්ප්‍රදායික තොරතුරු මූලාශ්‍ර හා අන්තර්ජාලය පදනම් කරගත් ඉලෙක්ට්‍රෝනික මූලාශ්‍ර අතර කියවීමේ වෙනස්කම් කිහිපයකි.

## පිටු පෙරලීම සහ පනිමින් කියවීම

කඩදාසි පොතක - පත්තරයක පිටු පෙරලන්නේ හරස් අතටයි. පරිගණකය මෙය අනුකරණයට කොතරම් උත්සාහ කළත්, විවිධ සීමාවන් බොහෝය. එනිසා එම කටයුත්ත සාමාන්‍යයෙන් සිදු වන්නේ ඉහළ සිට පහළට යි. මේ සඳහා පරිගණක තිරයේ වම් පැත්තේ ඇති කාණුවක් දිගේ බොත්තමක් ඉහළ-පහළ ගෙන යාමේ ක්‍රමයක් අනුගමනය වෙයි. එම ක්‍රියාව හඳුන්වන්නේ අනු චලනය (scrolling) නමිනි. වෙබ් අඩවි භාවිත කරන්නන් ගෙන් සියයට 90 ක් කියවීම සඳහා අනුචලනය භාවිත නොකරන බව ගෝල්ඩ්ස්බරෝ (2000) පවසයි. මුලින් දිස්වන තිරය පමණක් උඩින් පල්ලෙන් කියවමින්, පිටු අතර පැනීම වත්මන් තොරතුරු ගවේශකයාගේ පුරුද්ද වී ඇත.

එසේ රේඛීය කියවීමෙන් බැහැර වී, තැනින් තැනට පැනීමේ හැකියාව ලෝක ව්‍යාප්ත ජාලයේ (World Wide Web) බිහි වීමත් සමඟ ඇති විය. එය හැඳින්වූයේ අධි පෙළ (hypertext) නමිනි. ඔබ කියවමින් සිටින්නේ විකිපීඩියා විශ්වකෝෂය යැයි සිතමු. එහි දුටුගැමුණු රජු පිළිබඳ ලිපියක් ඇති අතර, ඒ තුළ අනුරාධපුරය පිළිබඳව ද සඳහන් වෙයි. එම වචනය අනුරාධපුර රාජධානිය පිළිබඳ විකිපීඩියා ලිපියට සම්බන්ධ කර තිබේ. අධි පෙළ මත ක්ලික් කිරීමෙන් එම ලිපිය දිග හැරේ.

මෙය දැනුම් රැස් කිරීමේ කලාවේ විප්ලවයක් ලෙසද හැඳින්විය හැකිය. එහෙත් එය රේඛීය කියවීම තරම් සුමට දෙයක් නොවේ. තැනින් තැනට පැන ගිය ආකාරය අමතක වී මංමුලා විය හැකි බැවිනි. මුද්‍රිත පිටුව ස්ථායී ය. එහිදී පාඨකයා ගමන් කළ යුතු ආකාරය තීරණය කිරීමේ භාර දූර වගකීම කරට ගන්නේ කතුවරයාය.ඉලෙක්ට්‍රෝනික ලේඛනයක කතුවරයා මෙම වගකීමෙන් කරමක් මිදෙයි. එහෙත් තවත් අතකින් බලන කල පාඨකයා පැන නොයෙන ලෙස රඳවා ගැනීමේ වැඩි වගකීමක් ඉලෙක්ට්‍රෝනික ලේඛනයේ කර්තෘ අත පවතී. තිරුනාරායනන් (2003) මෙම ස්වභාවය විස්තර කරන්නේ සිතීම සම්බන්ධ කර ගනිමිනි. ඔහු පවසන ලෙස පාඨකයා සිතීම වෙනුවට ක්ලික් කිරීම ආදේශ කරගෙන ඇත. සිතීම කරදරයක් බවට පත් වන්නේ කුමන අවස්ථාවක දී ද, එවිට එම පාඨකයා වෙනත් සබැඳියක් (link) මත ක්ලික් කරයි. ක්ලික් කිරීම සිතීමට වඩා පහසු ය. රැජාව අඩුය.

## තෝරා ගෙන කියවීම සහ අවධානය

කෙසේ නමුත්, මෙවැනි හැසිරීම් ධනාත්මක හෝ ඍණාත්මක වර්ධනයක් ලෙස පෙන්නුම් කිරීමට අප ඉක්මන් නොවන්නේ හේතු ඇතිවය. එනම්, පුවත් පත් හා ඒ ආශ්‍රිත ලිපි වැඩි වීමත් සමඟ ඉක්මන් කියවීමකට පසු අත්‍යවශ්‍ය ලිපි පමණක් කියවීමට තෝරා ගන්නා සේ, ජාලගත තොරතුරුද තෝරා බේරා ගෙන කියවීම සාධාරණීකරණය කළ හැකි බැවිනි.

බර්කර්ට්ස්(1996) මෙය වඩාත් සිත් ගන්නා සුළු ආකාරයෙන් ඉදිරිපත් කරයි." අපේ සංස්කෘතිය තුළ ප්‍රවේශය (access) ගැටළුවක් නොවේ. එහෙත් ප්‍රගුණනය (prolifera-tion) ගැටළුවකි. එසේම මුල් කාලයට වඩා කියවීමේ කාර්යයද වෙනසකට ලක්වී ඇත. ලේඛනවල සුලබතාවයෙන් ප්‍රමුදිත ව, එසේ ම භීතියට පත්ව, එකිනෙක අතර පවතින වෙනස හඳුනා ගැනීමටද අසමත් වන පාඨකයා, මූලාශ්‍ර මතුපිටින් අතගා බැලීමට පෙළඹෙයි. උඩින් කියවයි. කඩිනම කොතෙක්ද යත් වදන්වල අරුත් චිත්ත සන්තානයේ නින්නාද වන්නටද ඉස්පාසුවක් නැත. " එහි ප්‍රතිඵලය ලෙස, අපි අපේ මුල් පරම්පරා-වන්ට වඩා බොහෝ වැදගත් මෙන්ම නොවැදගත් තොරතුරු මාත්‍ර රාශියක් දනිමු.(සිම්ං 2008).

ඒ අනුව වර්තමානයේ කියවීම යනු ගිනි නිවීමේ බටයකින් වතුර බොනවා හා සමාන වූ ක්‍රියාවලියකි(එම). එහි දී වෙන කවරදාටත් වඩා "අවධානය" අවශය වේ. අවධානයෙන් හා කියවීමේ දක්ෂතාවලින් හෙබි විසි එක් වැනි සියවසේ පාඨකයා කිසියම් පටු විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ ව ගැඹුරු අවබෝධයක් ඇත්තෙකු වෙන්නේ මෙසේය.

ඇත්තෙන්ම ඩිජිටල් පාඨකයෝ මුද්‍රිත පාඨකයන්ට වඩා වැඩි නිමවුම්කරුවෝ වෙති. ඔවුහු දිනකට ඊ මේල් පණිවුඩ රැසක් කියවති.අන්තර්ජාලයේ අනේකවිධ වෙබ් අඩවි අතර සැරිසරති. තම බ්ලොග් අඩවියේ සටහන් තබති. අන් සටහන් කියවති. වෙනකක් තබා තැනින් තැනට යන අතරත් දුරකථන කෙටි පණිවුඩ යවති. කියවති මේ බහු කිච්ඡතාව නිසා වන අහිතකර ප්‍රතිඵලය නම්, එක් දෙයක් ගැන වැඩි වේලාවක් අවධානය රඳවා ගැනීම අපහසු වීමයි. උදාහරණ ලෙස ඉලෙක්ට්‍රොනික පොතක පිටුවක් කියවන අතරතුර ඊමේල් පණිවුඩයක් බැලීමට, චැට් කිරීමට, ෆේස්බුක් මිතුරෙකුට පිළිතුරු දීමට, අද පත්තරය කියවීමට මෙන්ම ක්‍රිකට් තරගයේ ලකුණු බැලීමටද සිත් විය හැකිය. අපහසුවක් නැත - සියල්ලම ඇත්තේ එකම මුහුණතක ජනේල (Windows)කිහිපයක් මත හෙයිනි. එය සමාන කළ හැක්කේ එක වර පොත් කිහිපයක් එක යට එක තබා ගෙන සිටීමය - වරින් වර ඉන් එකින් එක ඉදිරියට ගෙන කියවීමටය. එක් වරක් බහු කාර්ය කිරීමේ ස්වභාවය නිසා එක දිගටම කිසියම් කාර්යයකට අවධානය යොමු කර එය නිම කරනවාට වඩා සියයට පනහකින් වැඩි කාලයක් ගත වන බව ඩේවිඩ් මෙයර් නම් මනෝවිද්‍යා පර්යේෂකයා පවසයි(රිච්ටෙල් 2003).

## ටීකා, විස්තර, විවරණ ලිවීම

අධ්‍යයනයක හෝ ගැඹුරු කියවීමක යෙදෙන්නෝ කියවන ලේඛනය මතු පිට ම වදන්, වැකි හෝ වාක්‍යංශ ඉස්මතු කිරීමට (highlight) හා සටහන් තැබීමට (annotate) කැමතිය. පුස්තකාල පොත්පත්වල පවා ඡායා පිටපත් තබා ගැනීමට ශිෂ්‍ය ශිෂ්‍යයාවෝ පෙළඹෙන්නේ මේ හේතුව නිසාය. මේ සඳහා නම්, ඉලෙක්ට්‍රොනික ලේඛන ලබා දෙන්නේ අනගි සහයකි. පාට පෑන්, ඡායා පිටපත් කිසිවක් නැතිව ද මෙවැනි සටහන් තබා ගැනීමට (PDF) වැනි ආකෘති ඉඩ පහසුකම් සලසයි. එහෙත් මේ සඳහා විශේෂිත මෘදුකාංග අවශ්‍ය වේ. එවැනි මෘදුකාංග බහුලද නොවේ. පෑනකින් ඉරක් අඳින්නාක් මෙන් පහසු ක්‍රියාවක්ද නොවේ. මුද්‍රිත ලේඛන මත සාමාන්‍යයෙන් සටහන් තබන පාඨකයන්ද පරිගණකය මතුපිට දී බහුලව එසේ නොකරන බව පරීක්ෂණ වලින් හෙලි වී තිබේ.(සිමිං 2008). තවද මුද්‍රිත මතුපිටතදී තමන් රිසි සේ අත හසුරුවමින් රිසි බසකින් සටහන් තැබිය හැකිය. නමුත් ප්‍රතිවිරුද්ධ මාධ්‍යයේදී ක්ලික් කරන තරම් එය පහසු ක්‍රියාවක් නොවේ. මුද්‍රිත මතුපිටකදී සටහන් තැබීම කියවීමට උදව්වක් වුවත්, ඉලෙක්ට්‍රොනික මතුපිටක දී එ මගින් අවධානය වෙනතක ගෙන යා හැකිය. එ නිසා, සම්මත පරිගණක තිරය, යතුරු පුවරුව හා මවුසය යන සංයෝජනය තුළ, ලේඛනවලට අමතර සටහන් තැබීම එතරම් සාර්ථක ක්‍රමයක් නොවන බව පැවසිය යුතුය.

නිගමනය

අති විශාල තොරතුරු සමුදායක් මේ මොහොතේත් අන්තර්ජාලයට එක් වෙමින් තිබේ. ප්‍රකාශකයෝ තම මුද්‍රිත ප්‍රකාශන ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ද ඉදිරිපත් කරමින් ජාම බේරා ගත්හ. ඇතැම් ප්‍රකාශකයෝ තවත් පියවරක් ඉදිරියට ගොස්, ඉලෙක්ට්‍රොනික මාධ්‍ය සිය එකම ප්‍රකාශන මාධ්‍යය කර ගත්හ. කෙසේ වෙතත්, විශේෂයෙන් තරුණ හා ළමා පරපුර, ඉලෙක්ට්‍රොනික ලේඛන කරා වැඩි ආකර්ශනයක් දක්වති. එහෙත් මුද්‍රිත මාධ්‍යට ඇති ඉල්ලුම වැඩි වනු විනා, අඩු වීමේ ප්‍රවණතාවක් තවමත් දක්නට නැත. ඉලෙක්ට්‍රොනික මාධ්‍යයේ ප්‍රයෝජනය උකහා ගනිමින් අවධානය පැහැර ගැනීම වැනි උගුල්වලට හසු නොවී යහපත් කියවන්නකු වීම වත්මන් පාඨකයාගේ අභියෝගය යි.

ආශ්‍රිත මූලාශ්‍ර

Birkerts, S. (1996). Reading in the Electronic Era. Logos, 7(3), 211-214

Goldshborough. R. (2000). Text Demands Respect on the Web. Advertising Age. 71(32).44

Richtel, M. (2003) The Lure of Data : Is It Addictive? The New York Times. Retrieved 11/10//2011. from http ://www.nvtimes.com/2003/07/06/

Thirunarayanan, M. (2003). From Thinkers to Clickers : The World Wide Web and the Transformation of the Essence of Being Human. Ubiquitv. 4(12). Retrieved on 11/10 2011
from http://ubiquity.acm.org/article.cfm?id=777955

Ziming. L. (2008) Paper to Digital :Documents in the Informaton Age. Libraries Unlimited. Westport.

## ලේඛන සංරක්ෂණය හා ප්‍රවේශ වර්ධනය සඳහා සංඛ්‍යාංකකරණය යොදා ගැනීමේ අවශ්‍යතාව

*ජී. ඩී. අමරසිරි, අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය*

හැඳින්වීම

මුද්‍රිත තොරතුරු හා දැනුම සහිත පුස්තකාල, සාම්ප්‍රදායික පුස්තකාල ලෙස හඳුන්වනු ලැබේ.නමුත් වර්තමානයේ බොහෝ දෙනා සංඛ්‍යාංකකරණය (digitization) හා සංඛ්‍යාංක පුස්තකාල (digital library) පිළිබඳව කථා කරති. සංඛ්‍යාංක පුස්තකාලයක් තොරතුරු ලබා දීම සඳහා තොරතුරු තාක්ෂණය උපයෝගී කරගනු ලබන අතර එය විද්‍යුත් සම්පත් (electronic resources) වලින් සමන්විත වේ. සංඛ්‍යාංක පුස්තකාලයක් තනි ඒකකයක් වශයෙන් කටයුතු කිරීම අපේක්ෂා නො කෙරේ. ජාල තාක්ෂණය උපයෝගී කර ගනිමින් එය පුස්තකාල රාශියකට සම්බන්ධ වේ. ඒ අනුව සංඛ්‍යාංක පුස්තකාලයකට සම්බන්ධ වන පාඨකයාට ජාල සම්බන්ධතාව තුළින් පුස්තකාල රාශියකට සම්බන්ධ වීමට හැකියාව ලැබේ.

සංඛ්‍යාංක පුස්තකාලයක් යනු මූලික වශයෙන් ම පාඨක ප්‍රයෝජනය සඳහා තොරතුරු ලබා ගැනීම, ගබඩා කිරීම, සංවිධානය කිරීම හා බෙදා හැරීම සඳහා වූ පරිගණක පද්නම් කරගත් පද්ධතියකි. මෙවැනි පුස්තකාල තුළින් පාඨකයින්ට මාර්ගගත තොරතුරුවලට, ජාලවලට හා අන්තර්ජාලයට සම්බන්ධ වීම මගින් තොරතුරු ලබා ගැනීමට හැකි වේ.

### සංඛ්‍යාංක පුස්තකාල අවශ්‍ය වන්නේ ඇයි?

තොරතුරු ගවේශනය හා ප්‍රවේශය ඇති කිරීමේ මාර්ගයක් වශයෙන් අන්තර්ජාලය හා වෙබ් තාක්ෂණය ශීඝ්‍ර දියුණුවක් ලබා ඇත. විශාල තොරතුරු ප්‍රමාණයක් ගබඩා කළ හැකි දියුණු මාර්ගයක ගබඩා තාක්ෂණයක් ඇති වී ඇත. එමෙන්ම මේ තුළින් වඩා වේගවත් තොරතුරු ගවේශනය හා ලේඛන බෙදා හැරීමේ හැකියාවන් නිසා පාඨකයන්ට වඩා පහසු සේවාවක් ලබා දීමට මේ තුළින් හැකිවී ඇත.

සංඛ්‍යාංකකරණය නිසා තොරතුරුවලට වඩා පුළුල් ලෙස ප්‍රවේශ විය හැකි අතර එම තොරතුරු දුරස්ථ ස්ථානවල සිට පාලනය කළ හැකිය. එමෙන්ම ඉගැන්වීමේ හා ඉගෙනීමේ කටයුතු පහසු කර ගැනීමේ කටයුතු සඳහා ද සංඛ්‍යාංකකරණය උපයෝගී කරගත හැකිය. එමෙන්ම සංඛ්‍යාංක තොරතුරුවලට පාඨකයන් විශාල ප්‍රමාණයකට එකවර ප්‍රවේශ විය හැක.

සංඛ්‍යාංක තොරතුරු, දියුණු සමාජයත් නොදියුණු සමාජයත් අතර පරතරය සංඛ්‍යාංක විභේදනයයි (digital divide). තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT)

යනු සමාජ ආධාරක පද්ධතියකි. එනම් පුද්ගලයාගේ සමාජ අවශ්‍යතා සපුරා ගැනීමට ආධාර කරන ආධාරකයකි. තොරතුරු සන්නිවේදන තාක්ෂණය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරීවන සමාජ පද්ධතීන්, සමාජ ක්‍රියාවලීන් හා සමාජ සම්බන්ධතා හඳුනා ගැනීම සංඛ්‍යාංක විභේදනය අඩු කිරීමට ඉවහල් වේ.

සංඛ්‍යාංක පුස්තකාල ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමේ දී පොත්වලට ඇති වැදගත්කම ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම ද අවශ්‍ය වේ. තොරතුරු සන්නිවේදන තාක්ෂණය කෙතරම් දුරට දියුණු වුව ද පොත්පත්වලින් සමන්විත සාම්ප්‍රදායික පුස්තකාල පද්ධතිය ද ආරක්ෂා කරගත යුතුය. මෙහි දී සාම්ප්‍රදායික හා සංඛ්‍යාංක ස්වරූපයන් සාර්ථක ලෙස ඒකාබද්ධ කිරීම සඳහා යොමුකරවන ආකාරයේ ප්‍රතිපත්ති හා උපායමාර්ගික සැලසුම් සකස් කිරීම අවශ්‍ය වේ. සංඛ්‍යාංකකරණය නිසා පොත පාඨකයන්ගෙන් ඈත්කිරීම අපගේ ප්‍රතිපත්තිය නොවිය යුතුය. සංඛ්‍යාංකකරණ ප්‍රතිපත්ති සකස් කිරීමේදී අංශ ගණනාවක් කෙරෙහි සැලකිලිමත්වියයුතුය. නීතිමය ගැටළු එක් අංශයකි. කර්තෘ අයිතිය, නීතිමය ගැටළු, බුද්ධිමය දේපලහිමිකම් කෙරෙහි අවධානය යොමුකළ යුතුය. එමෙන්ම පුස්තකාලවල සංඛ්‍යාංක තොරතුරු වර්ධනය කිරීමේ දී එකතු සංවර්ධන ප්‍රතිපත්ති ද (Collection Development Policy) සංඛ්‍යාංකකරණයට අදාළ නව ප්‍රතිපත්ති ද සකස් කරගත යුතු වේ. එමෙන් ම සංඛ්‍යාංකකරණ ක්‍රියාවලිය සඳහා වෙනම ප්‍රතිපත්තියක් සකස් කර ගැනීම ද වැදගත් (digitization policy) වේ.

එමෙන් ම සංඛ්‍යාංකකරණ ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී අවධානය යොමු කළ යුතු තවත් අංශයක් ලෙස යටිතල පහසුකම් හැඳින්විය හැකිය. උපකරණ ගබඩා කිරීම, ඉඩකඩ පහසුකම්, පරිගණක ධාරිතාව, ජාලකරණය, දෘඩාංග හා මෘදුකාංග ආදී ගැටළු, ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී සලකා බැලිය යුතුය. එමෙන්ම සංඛ්‍යාංක තොරතුරුවලට ප්‍රවේශ වීම පිළිබඳවද (access) ප්‍රතිපත්ති සකස් කරගත යුතු වේ. උදාහරණ වශයෙන් සංඛ්‍යාංක තොරතුරු අන්තර්ජාලයට සම්බන්ධ කළ යුත්තේ සම්පූර්ණ පෙළද (full text) සාරාංශයද (abstract) යන කරුණු තීරණය කළ යුතු වේ. එමෙන් ම තොරතුරුවලට ප්‍රවේශ වෙන අය කවුද? තොරතුරුවලට ප්‍රවේශ වීමට නොමිලේ ලබා දෙන්නේ ද? ඒ සඳහා අය කිරීමක් කළ යුතු ද යන ප්‍රතිපත්තිමය කරුණු තීරණය කළ යුතුය.

එමෙන් ම සංඛ්‍යාංක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී විශාල මුදල් ප්‍රමාණයක් වැය වේ. උපකරණ මිලදී ගැනීම, කාර්ය මණ්ඩල පුහුණු කිරීම, මෘදුකාංග මිලදී ගැනීම, නඩත්තු කටයුතු ආදිය සඳහා වියදම් දැරීමට සිදුවේ. එමෙන්ම සංඛ්‍යාංක දත්ත පිළිබඳ දැනුවත් කිරීම, සංඛ්‍යාංක තොරතුරු පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක පාලනය, සංරක්ෂණය. ආදී කරුණු ද සංඛ්‍යාංක ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී සැලකිල්ලට ගත යුතුය.

සංඛ්‍යාංක ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේ දී පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගැනීම වැදගත්ය.

(1) අරමුණු
(2) ප්‍රතිපත්ති
(3) ලැබෙන ප්‍රයෝජන
(4) අරමුදල් ලබාගැනීම
(5) කාර්යාල ඉඩප්‍රමාණයන්
(6) ගබඩා කිරීම
(7) කාර්යමණ්ඩල බඳවා ගැනීම්
(8) කාර්යමණ්ඩල පුහුණු කිරීම
(9) කාර්ය හා වගකීම් පැවරීම
(10) අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය
(11) ප්‍රමිතීන් අනුගමනය කිරීම
(12) සම්පත් කළමනාකරණය
(13) අමතර පිටපත් (backups) තබා ගැනීම
(14) දිගුකාලීන සංරක්ෂණය

සංඛ්‍යාංකකරණය ප්‍රවර්ධනය කිරීමේදී ඒ පිළිබඳ අධ්‍යාපන හා පුහුණු කටයුතු ක්‍රියාත්මක කිරීමද අතිශයින් වැදගත් වේ. මෙය නව ක්ෂේත්‍රයක් නිසා අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භයේදී දුෂ්කර වීමට ඉඩකඩ තිබේ. පුහුණු වැඩටහන් ආරම්භ කිරීමේදී අදාළ පාඨමාලාවල මට්ටම් හා ඉලක්ක කණ්ඩායම් තීරණය කළ යුතු වේ. මෙම පාඨමාලා මට්ටම් දෙකකින් පැවැත්වීම වඩා යෝග්‍ය බව පෙනේ.

(1) සංඛ්‍යාංක එකතු සංවර්ධනය හා පවත්වාගෙන යාම සඳහා වන කණිෂ්ඨ මට්ටමේ වෘත්තිකයින් සඳහා වන පාඨමාලාව
(2) සංඛ්‍යාංක පුස්තකාල පද්ධතීන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඇගයීමේ කටයුතුවලට සම්බන්ධ ජ්‍යෙෂ්ඨ හා කළමනාකරණ මට්ටමේ වෘත්තිකයන් සඳහා වන උසස් මට්ටමේ පාඨමාලා

ලෝකයේ බොහෝ රටවල් සංඛ්‍යාංකකරණ ව්‍යාපෘති පවත්වාගෙන යයි. ඉන්දියාව, නේපාලය, චීනය, කියුබාව, කැනඩාව හා නවසීලන්තය එවැනි රටවලට උදාහරණ කිහිපයකි. ඉන්දියාව සංඛ්‍යාංකකරණ ව්‍යාපෘති පුළුල් වශයෙන් ක්‍රියාත්මක කරන රටකි. සංඛ්‍යාංක පුස්තකාල පිළිබඳ ජාත්‍යන්තර සමුළු ද ඉන්දියාව වරින් වර පවත්වා ඇත. මෙහි ප්‍රථම ජාත්‍යන්තර වැඩමුළුව පවත්වන ලද්දේ 2004 වර්ෂයේදීය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයද සංඛ්‍යාංකකරණ ව්‍යාපෘතියක් දැනට වසර කිහිපයකට පෙර ආරම්භ කළේය. ඒ යටතේ ජාතික පුස්තකාලය සතුව ඇති ජනශ්‍රැතිය පිළිබඳ අත් පිටපත් එකතුව සංඛ්‍යාංකකරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව කරගෙන යාමට දැනට සැලසුම් කර ඇත. විශේෂයෙන්ම දුර්ලභ ගණයේ පොත් හා පුවත්පත්

එකතුව සංඛ්‍යාංකකරණය කිරීමට අදහස් කර ඇත. ශ්‍රී ලංකාවේ ලේඛන උරුමය සංරක්ෂණය සඳහා තොරතුරු ප්‍රවේශය වර්ධනය සඳහාත් සංඛ්‍යාංකකරණය පුළුල්ව යොදාගත යුතුව ඇත.


## ආශ්‍රිත ග්‍රන්ථ

Gopal,Krishan, Digital Libraries in Electronic information Era, Authorspress:New Delhi,2000

International Conference on Digital Libraries : knowledge creaton preservation Access and Management, Energy and Resource Institute : New Delhi, 2004

Malavya, V. G. Electronic Libraries, ESS ESS Publishers : New Delhi, 1999

## තොරතුරු සාක්ෂරතාව සහ පොතපත කියවීම

*නදීකා සංජීවනී රත්නබාහු, සහකාර පුස්තකාලයාධිපති,*
*පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනය,*
*කැලණිය විශ්වවිද්‍යාලය*

රටක සංවර්ධනය මැනීමේ දී ඒක පුද්ගල ආදායම, ආයුකාලය, දළ ජාතික නිෂ්පාදනය මෙන්ම සාක්ෂරතා අගය ද (rate of literacy) ඉතා වැදගත් තැනක් ගනී. මේ අතුරින් සාක්ෂරතාව මානව ජීවිතයට බලපාන වැදගත් සාධකයක් ලෙස සඳහන් කළ හැකිය. උක්ත අනෙක් කාරනා ඉටු වීමට නම් මිනිසා සාක්ෂරතාවෙන් උසස් තත්වයක සිටීම අනිවාර්ය වන්නකි.

සාක්ෂරතාව යනු " සෙවීම හෝ භාෂා ලිවීමේ හැකියාව සහ සවන්දීම "ලෙස යුනෙස්කෝ සංවිධානය අර්ථකථනය කරයි. නවීන සමාජය වෙත ගමන් කිරීමට නම් සාක්ෂරතා හැකියාවෙන් යුක්ත වීම අනිවාර්ය සාධකයක් වේ. එදිනෙදා පුවත් පත් කියවීම, මගතොට තිබෙන විවිධ කරුණු දැන ගැනීමට, රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ වාද විවාද ඇතිකර ගැනීමට, ලෝකයේ සිදුවන විවිධ වෙනස්වීම් දැන ගැනීමට, තොරතුරු සාක්ෂරතාව අත්‍යවශ්‍ය වේ.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් වාර්තාවට අනුව 2007 / 2008 වසරවල දී තොරතුරු සාක්ෂරතාවේ ප්‍රමුඛයා බවට පත් වන්නේ ජෝර්ජියාව යි. එය සියයට සිය-යක ප්‍රතිශතයක් ගනී. රුසියාව, උස්බෙකිස්තානය සියයට අනූ නවයයි දශම හතරක (99.4%) ප්‍රතිශතයකින් සාක්ෂරතාව ඉහළ නංවාගෙන තිබේ. එක්සත් රාජධානිය සියයට අනූනවයක (99%) ප්‍රතිශතයකින් යුත් අතර උක්ත නිදසුන්වලට සාපේක්ෂව ශ්‍රී ලංකාව සියයට අනූවයි දශම හතක (90.7%) ප්‍රමාණයක මට්ටමක් පෙන්නුම් කරයි.

සාක්ෂරතාව බොහෝ රටවල ඉහළ අගයක් ගැනීමට හැකිය. නමුත් තොරතුරු සාක්ෂරතාව ඉහළ මට්ටමක රඳවා ගැනීම ඉතා සුවිශේෂී කරුණක් වේ. තොරතුරු සාක්ෂරතාව යනු " තොරතුරු අවශ්‍යතාව පවතින්නේ කුමන අවස්ථාවේද යන්න දැන ගැනීම, තොරතුරු හඳුනා ගැනීම, සොයා ගැනීම සහ තම ගැටළුව විසඳ ගැනීම සඳහා එම තොරතුරු කාර්යක්ෂම ලෙස යොදා ගැනීමට ඇති හැකියාව බව සෙන්ජෝස් ස්ටේට් (Senjose State) විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ පීඨාධිපති පැට්‍රිෂියා සෙනී දක්වයි. මෙම නිර්වචනයේ දැක්වෙන ආකාරයට තොරතුරු ක්ෂේත්‍රයේ නියැලී සිටින පිරිස් සහ පාඨකයන් යන දෙපාර්ශවය තුළ ම තොරතුරු සාක්ෂරතාව තිබීම අපේක්ෂා කෙරේ.

තොරතුරු ක්ෂේත්‍රයේ නියැලී සිටින පිරිස් හි තොරතුරු සාක්ෂරතාව පහත පරිදි විග්‍රහ කළ හැකිය. තොරතුරු සංවිධානය කිරීමේ ක්‍රමවේද, තොරතුරු පර්යේෂණ ක්‍රම, තොරතුරු පරිවපන ක්‍රම සහ තොරතුරු ඇගයීම ආදිය පිළිබඳ දැනුවත් විය

යුතුය. පාඨක තොරතුරු සාක්ෂරතාවයේදී තොරතුරු හඳුනා ගැනීම, තොරතුරු අවශ්‍ය වේලාවට තෝරා බේරා ගැනීම, තොරතුරු සංවිධානය කර ඇති ආකාරය පිළිබඳ දැනුම, තොරතුරු ඵලදායී ලෙස අවශ්‍ය කාරනය සඳහා යොදා ගැනීමට හැකි වීම යන කරුණු සලකා බැලේ.

තොරතුරු සාක්ෂරතාව වර්ධනය කර ගැනීමේ දී කියවීම (Reading) වැදගත් අංශයක් වේ. කියවීමට වයස, ජාති, කුල ආදිය බල නොපායි. මේ අතර ඕනෑම විෂයක ප්‍රවීන පුද්ගලයකු වීමට, ලෝකය දැකීමට, ඕනෑම ස්ථානයකට ගමන් කිරීමට, උපදෙස් ලබා ගැනීමට, භාවරසඥතාවන් අනාවරණය කර ගැනීමට, ආතතියෙන් මිදීම ආදී කරුණු සඳහන් කළ හැකිය.

ඇමෙරිකානු ජාතික රචකයෙක් සහ කාටූන් ශිල්පියෙකු වන Dr. Seuss Quotes දක්වන පරිදි "වැඩියෙන් කිය වූ විට, වැඩියෙන් දැනගත හැකි අතර බොහෝ දෑ ඉගෙන ගැනීම මගින් බොහෝ ප්‍රදේශවලට ගමන් කළ හැකිය."

කියවීම යනු බොහෝ විෂයන් පිළිබඳ තොරතුරු දැන ගැනීමට ඇති පහසු මගකි. මර්කස් ටියුලියස් " පොත්පත් නොමැති නිවසක් ආත්මයක් නොමැති ශරීරයක් " ලෙස හඳුන්වාදෙනු ලබයි. (A home without books is a body without soul) කියවීම එතරම්ම මිනිසා සමග සම්බන්ධ වී ඇති බව එයින් මනාව පැහැදිලි වේ. කියවීම සඳහා බාල, තරුණ, මහලු භේදයක් නොමැත. භාෂා, ජාති, කුලගොත් භේදයක් නොමැත. සෑම මිනිසකුම බොහෝ සාර්ථකත්වයන් ලබා ගන්නේ කියවීම තුළිනි. වික්ටර් හියුගෝ සඳහන් කරන පරිදි " ගිනි දැල්ලට එළිය මෙන් ඉගෙනීමට කියවීම ආලෝකයකි ; සෑම අක්ෂරයක්ම ගිනි පුපුරක් සේ දැල්වෙන්නේය." මෙම කියමන කෙතරම් දුරට යථාර්ථයක් බවට පත්ව තිබේදැයි වර්තමාන සමාජය නිරීක්ෂණය කිරීමෙන් පෙනී යයි.

එබැවින් වර්තමානයේ අප ජීවත්වන්නේ තොරතුරු විප්ලවීය සමාජයකය. මෙම සංකීර්ණ සමාජයෙහි තම අවශ්‍යතාවට සරිලන තොරතුරු තෝරා බේරා ලබා ගැනීම සඳහා කියවීම (Reading) අත්‍යවශ්‍ය කරුණක් වශයෙන් සඳහන් කළ හැකිය. කියවීම යනු සක්‍රීය මානසික ක්‍රියාවක් (Active Mental Process) වේ. රූපවාහිනිය මගින් මනස භාවිත කිරීමට හුරු කිරීම සිදු කළ ද පොත පත කියවීම මගින් මිනිසා කැපී පෙනෙන වඩාත් තාර්කිකව කටයුතු කරන පුද්ගලයෙකු බවට පත් කෙරේ.

විවිධ පුද්ගලයන්ගේ පරමාර්ථ මත කියවීම වෙනස් වේ. නිදසුනක් ලෙස පාසැල් ළමුන් භාවිත කොට ටෙලා (Tella) විසින් 2007 වසරේ සිදුකරන ලද පර්යේෂණ සඳහන් කළ හැකිය. එහිදී විභාගය සමත් වීම, විනෝදය සඳහා, පෞද්ගලික සංවර්ධනය සඳහා, කාලය ගෙවා දැමීම සඳහා තොරතුරුවලින් දැනුවත් භාවයට පත්වීම සඳහා පොතපත කියවන බව අනාවරණය කොටගෙන තිබේ.

## කියවීමේ වැදගත්කම:

"කියවීම මිනිසා සම්පූර්ණ කරයි" යන කියමන වර්තමාන සමාජය සඳහා ද වලංගු වේ. විවේක කාලය ප්‍රයෝජනවත් අයුරින් ගත කිරීමට කියවීම වැදගත් වේ. එමගින් ජීවිතයේ පරිපූර්ණත්වය උදෙසා ලැබෙන දායකත්වය ඉතා වැදගත්ය. විශේෂයෙන්ම චෛතසික හැඟීම් පාලනය කර ගැනීමට කියවීම ඉමහත් රුකුලක් වේ. සිග්මන් ප්‍රොයිඩ් නම් මනෝ විද්‍යාඥයා සඳහන් කරන පරිදි මිනිස් සිතෙහි ඇතිවන විවිධ මානුෂික හැඟීම් (උදා: කෝපය, බිය, හීන්නෝන්මාදය, වෛරය සාංකාව ආදිය පාලනය කිරීමට කියවීම ඉතා වැදගත්ය. ගැටළු සඳහා නව විසඳුම් සොයා ගැනීමටද කියවීම ඉවහල් වේ. එපමණක් නොව විෂය බාහිර දැනුම වර්ධනයට, යාවත්කාලීන (Update) වන තොරතුරු දැනගැනීමට, දැනුම නිවැරදිව ග්‍රහනය කර ගැනීමට කියවීම අත්‍යාවශ්‍ය වේ.

මීට අමතරව වාග්මාලාව සංවර්ධනය කරගැනීම, අභිමානය වර්ධනය කර ගැනීම,මතකය වර්ධනය කර ගැනීම, ගුණධර්ම වර්ධනය කර ගැනීම, නිර්මාණාත්මකබව වර්ධනය කර ගැනීම, නව මානසික සම්බන්ධතා ගොඩනගා ගැනීම, මුදල් ඉතිරි කර ගැනීම, වැරදිවීම් අවම කර ගැනීම, ජීවිතය අලුත් කර ගැනීම, මානසික ආතතියෙන් මිදීම ආදී විවිධ කරුණු සඳහා කියවීම වැදගත් සාධකයක් වේ.

## කියවීමේ පුරුද්ද ඇති නො වීමට බලපෑ හේතු

දියුණු වෙමින් පවත්නා රටවල කියවීමේ පුරුද්ද ඇති නො වීමට බලපෑ හේතු කිහිපයක් වේ.

1) මිනිසා කියවීමේ සමාජයකට වඩා කථා කිරීමේ සමාජයක ජීවත් විම
We are not reading society, But chatting society.
2) විද්‍යුත් මාධ්‍යවල බලපෑම

ආදිය මේ සඳහා හේතු වී ඇත.

## කියවීම දියුණු කිරීම සඳහා විවිධ පාර්ශවයන්හි කාර්යභාරය

කියවීමේ පුරුද්ද ඇති කිරීමට සමාජයේ විවිධ පිරිස් ක්‍රියා කළ යුතුය. විශේෂයෙන්ම පවුල, ජනමාධ්‍ය, රජය සහ පුස්තකාල සඳහා වන වගකීම සුළුපටු නොවේ.

කියවීමේ පුරුද්ද නිවස තුළින්ම ඇරඹිය යුත්තකි. විශේෂයෙන්ම දෙමාපියන් විසින් කුඩා දරුවන්ව මේ සඳහා පෙළඹවීමට කටයුතු කළ යුතුය. මේ සඳහා ශබ්ද නගා කථන්දර කියවීම, පුස්තකාල නැරඹීම සඳහා රැගෙන යාම, ත්‍යාග සඳහා පොත් ලබාදීම, නිවස තුළ කුඩා කියවීමේ ස්ථානයක් සැකසීම ආදී දෑ කළ හැකිය.

කියවීමේ ව්‍යාපෘති ඇති කිරීම, සම්මන්ත්‍රණ හා වැඩමුළු මෙන්ම ගම් මට්ටමින් පුස්තකාල ඇති කිරීමට සහයෝගය ලබා දීම ආදී කරුණු විවිධ මාධ්‍ය ආයතන මගින් සිදුකළ හැක.

කියවීමේ පුරුද්ද සමාජය තුළ ඇති කිරීමේදී ප්‍රබල බලපෑමක් කිරීමේ හැකියාව පුස්තකාල සතුය. ජාතික පුස්තකාලය, පාසැල් පුස්තකාල, මහජන පුස්තකාල, විශ්වවිද්‍යාල පුස්තකාල සහ විශේෂ පුස්තකාල ආදී සියලුම පුස්තකාල මේ සඳහා දායකත්වය සැපයීම වැදගත්ය. මේ අනුව පුස්තකාල මගින් සිදුකළ හැකි විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ සොයා බැලීම වැදගත්ය.
පුස්තකාල මගින් කියවීමේ සමාජ පිහිටුවීම වැදගත්ය. මෙමගින් කතුවරු සහ පොත් පිළිබඳ සාකච්ඡා කිරීමට හැකි වේ. එමෙන්ම නව ක්‍රම හඳුන්වා දීම සහ පුස්තකාල භාවිතය වැඩි දියුණු කර කියවීමේ පුරුද්ද වර්ධනය සඳහා පුස්තකාල සතියක් පැවැත්වීම වැදගත්ය. කියවීමේ ආශාව ඇති නමුත් පොත් පත් භාවිතය සඳහා පුස්තකාල වෙත යාමට නොහැකි පිරිස් සඳහා ජංගම පුස්තකාල සේවා පැවැත්විය හැක. නිදසුනක් ලෙස රෝහල්, බන්ධනාගාර සහ ඈත දුෂ්කර ගම්මාන සඳහන් කළ හැකිය.

ජනප්‍රියතම කෘති තේරීමේ දීප ව්‍යාප්ත තරඟ පුස්තකාල මගින් පැවැත්විය හැකිය. මෙමගින් පොත් පත් රචකයන් මෙන්ම පාඨකයන් තුළ ද උද්යෝගීමත් හැඟීමක් ඇතිවනු ඇත. බොහෝ බටහිර රටවල මෙවැනි තරඟ පැවැත්වේ. මෙමගින් ජනතාවගේ කියවීමේ පුරුද්ද වැඩි දියුණු වනු ඇත. විවිධ පුස්තකාල මගින් පවත්වන ජාතික, ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශන කියවීමේ පුරුදු වර්ධනයට ඉවහල් වන තවත් කරුණකි. මීට අමතරව පොත් ප්‍රකාශකයන් විසින් පවත්වන ජාතික, ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශන ද ඉතා වැදගත් වේ. සාහිත්‍ය මාසය වෙනුවෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වෙන ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය වැනි ප්‍රදර්ශන රටක ජනතාවට කියවීමට දිරි දීමකි.

ඉෆ්ලා සංවිධානය (IFLA) සඳහන් කරන පරිදි ජනතාව වෙත පොත් රැගෙන යාම (Bringing books to public) ඉතා වැදගත්ය. විශේෂයෙන්ම ග්‍රන්ථ කතුවරු, නවකථාවල චරිත, පොත් සාප්පු හා පුස්තකාලවල සිතියම් මහජනතාවට ප්‍රදර්ශනය මේ අතර වේ.

එමෙන් ම ග්‍රාමීය මට්ටමෙන් පොත් කියවන කණ්ඩායම් ඇති කිරීම, පොත් කියවන හා නොකියවන මහජනතාව කියවීම පිළිබඳ දැනුවත් කිරීම, ඒ සඳහා අත් පත්‍රිකා බෙදා හැරීම ජනතාව අතරට යා හැකි විවිධ ක්‍රම වේ. මේ සඳහා සියලුම පුස්තකාලවලට විවිධාකාරයේ දායකත්වයන් දැක්විය හැකිය.

මීට අමතරව පාසැල් පුස්තකාල හා මහජන පුස්තකාල සිසුන්ගේ කියවීමේ පුරුද්ද වර්ධනය කිරීමට මූලික අඩිතාලම දැමිය යුතුය. වැඩිහිටියන් වූ පසුද ඔවුන් කියවීම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිසක් බවට පත් වන්නේ එමගිනි.
කියවීමේ වැඩසටහන් ඇති කිරීම තවත් එවැනිම ක්‍රමයකි. එම වැඩසටහන් අතර කියවීමේ කඳවුරු ඇති කිරීම සිදුකළ හැකිය. මෙමගින් විවිධ පුද්ගල හැකියාවන් වර්ධනය වේ.

මීළඟ කරුණ වන්නේ කියවීමේ තරඟ පැවැත්වීමයි. මෙමගින් පොත පිළිබඳ සාරාංශයක් ලිවීම සිදුවන අතර ඒ සඳහා අදාළ කෘති පුස්තකාලය විසින් තෝරා බේරා දිය යුතුය. එමෙන් ම අලුතින් නිකුත්වන පොත් පිළිබඳව සොයා බැලීම මෙන්ම ඒවා පාඨකයන් අතට පත් කිරීමද කියවීමේ පුරුද්ද වර්ධනය කිරීමට රුකුල් දීමකි. මීට අමතරව කියවීමේ තරඟ පැවැත්වීම තුළින් ළමුනට පෙළ පොත් කියවීමට උනන්දුවක් ඇති වේ.

කුඩා දරුවන් සඳහා පොත් හඬ නගා කියවීමට පුස්තකාල තුළ ඉඩසලසා දිය යුතුය. එමෙන්ම ළමුන් ප්‍රිය කරන පරිසරයක් ඒ තුළ ඇති කිරීමද වැදගත්වේ. නිර්මාණාත්මක කවි කථා මෙන්ම ලොකු පින්තූර සහිත කථාන්දර පොත්, රූප කථා පොත් ලබාදීම ද කළ යුතුය. මෙමගින් චිත්‍රය බලා කථාව කීමේ හැකියාව ළමුනට ලැබේ.

මීට අමතරව මහජන හා පාසැල් පුස්තකාල මගින් කථා කියාදීමේ පැයක් (Library Story Hours) ඇතිකළ හැකිය. නිදසුනක් ලෙස බටහිර ලෝකයේ මහජන පුස්තකාලවල ළමා පාඨකයින්, තරුණ පාඨක පිරිස් සඳහා පැවැත්වෙන කථා කියවීමේ පැය සඳහන් කළ හැකිය. (Hillsboro Public Library) මගින් පුස්තකාල කථා පැයක් පවත්වන බව www.hillsborolibrary.org/news-lib-events/library-story-hour.ics වෙබ් අඩවිය නිරීක්ෂණය කිරීමෙන් පෙනී යයි. ඉෆ්ලා සංවිධානය තව දුරටත් කරුණු දක්වන ආකාරයට " කියවීමේ පුරුද්ද වර්ධනය වීමට විවිධ ඉදිරිපත් කිරීම් ඉතා සුවිශේෂී දායකත්වයක් දක්වයි. මේ අතර නාට්‍යානුසාර ක්‍රියාකාරකම් එනම් කිසියම් නව කථාවක හෝ පොතක කොටසක් නාට්‍යානුසාරයෙන් රඟ දැක්වීමට හැකියාව ඇත. රූකඩ යොදා ගනිමින් රඟ දක්වන කෘතියේ කරුණු පිළිබඳවද ළමුන් දැනුවත් කළ හැකි අතර කෘතිය නැවත නැවත කියවීම ද සිදුවේ." යනුවෙන් සඳහන් කරයි.

එපමණක් නොව සෑම පුස්තකාලයක්ම පාඨකයා නව කියවීමේ මාධ්‍ය වෙත යොමු කිරීම මෙන්ම පුහුණු කිරීමද සිදුකළ යුතුය. නිදසුනක් ලෙස පරිගණක මෙන්ම අන්තර්ජාල භාවිත කොට කියවීම සඳහන් කළ හැකිය. පාඨකයන් තුළ කියවීමේ රුචිකත්වය හා කුසලතා වර්ධනය කිරීම ආරම්භ කළ යුත්තේ කුඩා කල පටන්ය. එබැවින් පාඨකයන් වෙත පුස්තකාලයෙහි වඩාත් සැප පහසු, නිසංසල, කාර්යක්ෂම හා සුහදශීලී පරිසරයක් ගොඩනැගීම ද අත්‍යාවශ්‍ය කරුණක් වේ.

මේ සඳහා රජය මගින් ජාතික, භාෂා හා සාහිත්‍යය ඒජන්සි, ජාතික පොත් සංවර්ධන කමිටු, (National Book Development committee) කියවීමේ සංගම් (Reading Associations) ආදිය ප්‍රාදේශීය වශයෙන් ඇති කිරීමට සහයෝගය දැක්වීම සිදුකළ යුතුය.

කියවීමට නොහැකිවීම සමාජයකට මෙන්ම පුද්ගල අභිවෘද්ධියට ද බලපාන සාධකයකි. එහි ප්‍රතිඵලයන් ශාරීරික, මානසික හා සංස්කෘතිකමය වශයෙන් දක්නට ලැබේ. මෙම තත්වය කියවීමේ නොහැකියාව (Readind disasbility) නිසා ඇතිවන තත්වයන් වේ. ශාරීරික වශයෙන් ද මානසික වශයෙන් ද අසාර්ථක වීමට ඇති බිය වැනි තත්වයන් ඇති වේ. ළමා සෞඛ්‍ය හා මානව සංවර්ධන ජාතික ආයතනය පවසන පරිදි අවුරුදු 9 වන විට මූලික කියවීමේ කුසලතා වර්ධනය කිරීමට නොහැකි පිරිස් ජීවිත කාලය පුරාම සාක්ෂරතාවයෙන් තොර බව හෙළිදරව් කරගෙන ඇත. මේ අනුව පුද්ගලයන් තුළ කියවීමේ හැකියාව වර්ධනය වී තිබීම ඉතා වැදගත් කාරණයක් ලෙස හැඟී යනු ඇත.

**කියවීමේ පුරුද්ද වර්ධනය කර ගැනීමේ විවිධ ක්‍රම**

කියවීමේ පුරුද් ද වර්ධනය කිරීමට විවිධ පාර්ශව කටයුතු කරන විට සමාජයේ කියවන පාඨකයන් ද තමාගේ කියවීමේ පුරුද්ද වර්ධනය කර ගැනීමට හෝ එවැනි පුරුද්දක් තම ජීවිතය තුළ වගා කර ගැනීමට (Cultivate reading habit) කටයුතු කළ යුතුය. විශේෂයෙන්ම ඒ සඳහා කියවන පාඨකයන්ට විවිධ ක්‍රම අනුගමනය කළ හැකිය.

කියවීම සඳහා දිනක් තුළ විනාඩි 5 ක් හෝ 10 ක් වෙන්කර ගැනීමට හැකියාව ඇත. නිදසුන් ලෙස උදෑසන ආහාරය, දහවල් ආහාරය අතරතුර මෙන්ම නින්දට යාමට පෙර කියවීමට අවස්ථාව උදාකර ගත හැකිය. මේ ආකාරයෙන් දිනකට විනාඩි 10 බැගින් හතර වතාවක් කියවීම සිදු කළේ නම් දිනකට විනාඩි 40 ක් පමණ කියවීමට අවස්ථාව ලැබේ. මෙය වඩා හොඳ ආරම්භයක් වේ.

ඕනෑම ස්ථානයකට ගමන් කරන විට පොතක් රැගෙන යාම (Carry a book) ද ඉතා වැදගත්ය. නිදසුන් ලෙස යම් යම් ස්ථානවල හෝ කාර්යාලයක් තුළ රාජකාරියක් කර ගැනීමට යන විට නිකරුණේ ගත කිරීමට සිදුවන කාලය කියවීම තුළින් අර්ථවත් කරගත හැකිය.

පොත් ලැයිස්තුවක් සකසා ගැනීම ද කියවීමේ පුරුද්ද ඇති කරගත හැකි ක්‍රමයකි. කියවීමේ ප්‍රමුඛත්වය මත කියවීමේ පොත් ලැයිස්තුවක් සටහන් පොතක, තම පසුම්බිය තුළ මෙන්ම පරිගණකයේ පුද්ගලික වෙබ් පිටුව තුළ තබා ගත හැකිය. ඒ අනුව තමන් මෙතෙක් කියවා ඇති පොත් පිළිබඳ තෘප්තියට පත්විය හැකිය.

කියවීමට සුදුසු පරිසරයක් නිවස තුළ ගොඩනගා ගැනීමද කියවන පාඨකයාගේ යුතුකමකි. මේ සඳහා වඩා සැප පහසු නිසංසල වට පිටාවක් සකසා ගත යුතුය. පවුලේ සාමාජිකයන්ගෙන් බාධා නොවන, සංගීතය, මෙන්ම වෙනත් ඝෝෂාකාරී ශබ්දවලින්ද මනස වෙන් කොට නිසංසල පරිසරයක් නිවස තුළ සකසා ගැනීමේ අවකාශය පාඨකයාට තිබිය යුතුය.

අර්ථයකින් තොරව අන්තර්ජාල මෙන්ම රූපවාහිනිය භාවිතය සිදු නොකොට එම කාලය කියවීම සඳහා යොදා ගත හැකිය. පවුලේ සියලුම සාමාජිකයන් මේ සඳහා පොළඹවා ගත යුතුය. නිතර නිතර පොත් සාප්පු මෙන්ම පුස්තකාල ඇසුරෙන් කාලය ගෙවීම තුළින් කියවීම සඳහා නව පොත් පත් සොයා ගැනීමේ හැකියාව ලැබේ.කියවීමේ පැයක් හෝ දිනක් මාසයක් තුළ සකසා ගත හැකිය. මෙවැනි බොහෝ ක්‍රියාකාරකම් කියවන්නන් විසින්ම සිදුකළ හැකිය.මේ අනුව කියවීමේ පුරුද්ද වයස් භේදයකින් තොරව වර්ධනය කරගත යුතු සාධනීය කරුණක් ලෙස සඳහන් කළ හැකිය.

Bibliography

Effective methods of promote Reading Habits in Asia and the Pacific.
Report : 22nd Training Course on Book Promotion to Asia and the Pacific,
17 Nov - 5 Dec.
Tokyo : ASEAN Cultural Centre for UNISCO. 1989

14 ways to cultivate a lifetime reading habit,
http://www.lifehack.org/articles/lifestyle/14-ways-ti-cultivate- a-lifetime-reading-habit.html

Sangkaeo, Somsong, Reading habit promotion in ASEAN libraries, Paper Presented in 65th IFLA council and General Conference : Bangkok, August 20 - August 28, 1999.

Tella, Adenyink Children Reading Habit and Availability of Books in Botswana Primary : Implication for Achieving Quantity Education Vol. 7, No. 2, August 2007,

The 26 major advantages to reading more books and why 3in 4 people are being shut out of success, Cited on http://www.peristevceunlimited.com

Vega, Joes Antonio Merlo, School libraries information literacy and reading promotion initiatives iv Spain, Cited on 35_Annual_Conference_international_Association_of_school_leadership_ lisbon_3/7_July_2006

Why literacy is important Cited on http://www.hrsdc.gc.ca/en/cs/comm./reports/literact

Why read, Cited on http://www.rif.org

**www.hillsborolibrary.org**/news-events/lib-events/**library-story-hour**.ics

http://www.ifla.org/

## 2010 - ජාතික කියවීමේ මාසය වෙනුවෙන් ප්‍රාදේශීය වැඩ සටහන් ඉටුකළ පුස්තකාල සඳහා සම්මාන

### කොළඹ දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | ජනසෙත මහජන පුස්තකාලය, මොරටුව ම.න.ස | - | සම්මාන |
| 2 | පන්නිපිටිය ධර්මපාල ප්‍රාථමික විද්‍යාලය | - | සම්මාන |
| 3 | පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය | - | සම්මාන |
| 4 | විශාඛා විද්‍යාලය කොළඹ | - | සම්මාන |

### ගම්පහ දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 5 | හෙනරත්ගොඩ මහජන පුස්තකාලය, ගම්පහ ප්‍රාදේශිය සභාව | - | සම්මාන |
| 6 | කැල/විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය | - | සම්මාන |

### කළුතර දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 7 | තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය, හොරණ | - | සම්මාන |
| 8 | හො/ හන්දුපැල්පොල කණිෂ්ඨ විද්‍යාලය, කුඩාඋඩුව | - | විශිෂ්ට |
| 9 | කළුතර සංස්කෘතික මධ්‍යස්ථානය | - | සම්මාන |

### කුරුණෑගල දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | හිඳව මහජන පුස්තකාලය, පඬුවස්නුවර ප්‍රාදේශිය සභාව | - | සම්මාන |
| 2 | හුණුගම මහජන පුස්තකාලය, පඬුවස්නුවර ප්‍රාදේශිය සභාව | - | සම්මාන |
| 3 | රස්නායකපුර මහජන පුස්තකාලය, නිකවැරටිය ප්‍රාදේශිය සභාව | - | විශිෂ්ට |
| 4 | ගල්ගමුව මහජන පුස්තකාලය, ගල්ගමුව ප්‍රාදේශීය සභාව | - | සම්මාන |
| 5 | ඇහැටුවැව මහජන පුස්තකාලය, ගල්ගමුව ප්‍රාදේශීය සභාව | - | සම්මාන |
| 6 | කු/ශ්‍රී සරණංකර ජාතික පාසැල, බිංගිරිය | - | සම්මාන |

## රත්නපුර දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | කුමාරතුංග මහජන පුස්තකාලය. ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව | - | සම්මාන |
| 2 | නිදහස් ස්වර්ණ ජයන්ති ම. පු.,බෙලිහුල්ඔය, ඉඹුල්ලේ ප්‍රාදේශිය සභාව | - | සම්මාන |
| 3 | බලංගොඩ මහජන පුස්තකාලය, බලංගොඩ | - | සම්මාන |
| 4 | ඇඹිලිපිටිය මහජන පුස්තකාලය, ඇඹිලිපිටිය නගර සභාව | - | සම්මාන |
| 5 | ගන්කන්ද ජාතික පාසැල, පැල්මඩුල්ල | - | සම්මාන |

## කෑගල්ල දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 6 | උස්සාපිටිය මහජන පුස්තකාලය, අරණායක ප්‍රාදේශීය සභාව | | සම්මාන |
| 7 | අරණායක මහජන පුස්තකාලය, අරණායක ප්‍රාදේශීය සභාව | - | සම්මාන |
| 8 | දරණියගල මහජන පුස්තකාලය, දැරණියගල ප්‍රාදේශීය සභාව | | සම්මාන |
| 9 | ගෝනගල්දෙණිය මහජන පුස්තකාලය, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව | - | විශිෂ්ට |
| 10 | රුවන්වැල්ල මහජන පුස්තකාලය, රුවන්වැල්ල ප්‍රාදේශිය සභාව | - | විශිෂ්ට |
| 11 | අමිතිරිගල මහජන පුස්තකාලය, රුවන්වැල්ල ප්‍රාදේශිය සභාව | - | විශිෂ්ට |
| 12 | ඉඹුලාන මහජන පුස්තකාලය, රුවන්වැල්ල ප්‍රාදේශිය සභාව | - | සම්මාන |
| 13 | බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලය, හෙට්ටිමුල්ල | - | සම්මාන |
| 14 | කෑගලු විද්‍යාලය, කෑගල්ල | - | විශිෂ්ට |
| 15 | කෑගලු බාලිකා විද්‍යාලය, කෑගල්ල | - | විශිෂ්ට |

## ගාල්ල දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | සිරිනාවතී ද සිල්වා අනුස්මරණ ම.පු., අම්බලන්ගොඩ ප්‍රා. ස. | - | සම්මාන |
| 2 | කලේගාන මහජන පුස්තකාලය, බෝපේ පෝද්දල ප්‍රා.ස. | - | සම්මාන |
| 3 | ගා/දේවපතිරාජ විද්‍යාලය, රත්ගම | - | සම්මාන |
| 4 | අම්බලන්ගොඩ නගර සභාව | - | සම්මාන |

**මාතර දිස්ත්‍රික්කය** -

| | | | |
|---|---|---|---|
| 5 | දෙනියාය මහජන පුස්තකාලය, කොටපොල ප්‍රාදේශීය සභාව | - | සම්මාන |
| 6 | ජාතික රූපවාහිනී පුස්තකාලය, නොටොල්පිටිය, හම්බන්තොට, තංගල්ල ප්‍රා.ස. | - | සම්මාන |
| 7 | පල්ලිත්කුඩාව මහජන පුස්තකාලය,නොටොල්පිටිය, හම්බන්තොට, තංගල්ල ප්‍රා.ස. | - | සම්මාන |
| 8 | හක්මන මහජන පුස්තකාලය, හක්මන ප්‍රාදේශීය සභාව | - | විශිෂ්ට |
| 9 | මාර/නිල්වලා ආදර්ශ විදුහල, පල්ලියමුල්ල මාතර | - | සම්මාන |
| 10 | මාර/තල්පාවිල මිහිඳු ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය | - | විශිෂ්ට |

**මධ්‍යම පළාත - මහනුවර දිස්ත්‍රික්කය**

| | | | |
|---|---|---|---|
| 1 | කුරුඳුවත්ත මහජන පුස්තකාලය, ගඟඉහළ කෝරළය ප්‍රාදේශීය සභාව | - | විශිෂ්ට |
| 2 | ගම්පොළ මහජන පුස්තකාලය, ගම්පොළ නගර සභාව | - | සම්මාන |
| 3 | ගල්ගෙඩියාව මහජන පුස්තකාලය, ගම්පොල නගර සභාව | - | සම්මාන |
| 4 | ඇල්පිටිකන්ද මහජන පුස්තකාලය, උඩුනුවර ප්‍රාදේශීය සභාව | - | සම්මාන |
| 5 | ලංකාතිලක මහජන පුස්තකාලය, උඩුනුවර ප්‍රාදේශීය සභාව | - | සම්මාන |
| 6 | දවුළුගල මහජන පුස්තකාලය, උඩුනුවර ප්‍රාදේශීය සභාව | - | සම්මාන |
| 7 | දොළුව මහජන පුස්තකාලය, උඩපළාත ප්‍රාදේශීය සභාව | - | විශිෂ්ට |
| 8 | නාවලපිටිය මහජන පුස්තකාලය නාවලපිටිය ප්‍රාදේශීය සභාව | - | විශිෂ්ට |
| 9 | උඩිස්පත්තුව මධ්‍ය මහා විද්‍යාලය, උඩිස්පත්තුව | - | සම්මාන |
| 10 | පූජාපිටිය සංස්කෘතික මධ්‍යස්ථානය, ගොඩමහන | - | සම්මාන |
| 11 | මහ/විහාරමහා දේවී බාලිකා විද්‍යාලය,මහනුවර | | සම්මාන |

**මාතලේ දිස්ත්‍රික්කය**

| | | | |
|---|---|---|---|
| | මා/ දූල්ලෑව මහා විද්‍යාලය, මාතලේ | - | සම්මාන |

**ඌව පළාත - මොනරාගල දිස්ත්‍රික්කය**

| | | |
|---|---|---|
| 1 | මො/ඇතිලිවැව මහා විද්‍යාලය, ඇතිලිවැව | සම්මාන |
| 2 | මො/දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලය, බූත්තල | සම්මාන |
| 3 | බණ්ඩාරවෙල මහජන පුස්තකාලය, බණ්ඩාරවෙල ප්‍රා.ස. | සම්මාන |

**යාපනය/වව්නියාව සහ කිලිනොච්චිය දිස්ත්‍රික්ක**

| | | |
|---|---|---|
| 1 | වව්නියා මහජන පුස්තකාලය | විශිෂ්ට |
| 2 | කයිනඩ් මහජන පුස්තකාලය | විශිෂ්ට |
| 3 | සරසාලයි මහජන පුස්තකාලය | සම්මාන |
| 4 | නාවට්කුලි මහජන පුස්තකාලය | විශිෂ්ට |
| 5 | කච්චායි මහජන පුස්තකාලය | සම්මාන |
| 6 | කල්/අල්-පාත්රියා මහා විද්‍යාලය, කල්මුණේ | සම්මාන |

ISBN 978-955-8383-71-1

*Wijitha Printers & Traders - Colombo 08*

**National Digitization Project**

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board. Colombo 07
2. Date Scanned : 2017/11/01
3. Name of Digitizing Company : Sanje (Private) Ltd. No 435/16. Kottawa Rd. Hokandara North, Arangala. Hokandara
4. Scanning Officer

Name : N.D.R. Gamage

Signature : ...

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according the norms and standards of digital scanning accurately, also keeping with the originality of the origin document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ...

Date : 2017/11/01

*"This document/publication was digitized under National Digitization Project of th*